සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

084528

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

තෙවන වාර පරීක්ෂණය
மூன்றாம் தவணைப் பரீட்சை - 2026
Third Term Test

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade } 13 | විෂයය / பாடம் / Subject } සිංහල | පත්‍රය / வினாத்தாள் / Paper } I | පැය / மணித்தியாலம் / Hours } 3 |

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත්, උත්තර ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.

01. පහත දැක්වෙන (අ), (ආ), (ඉ), (ඊ) හා (උ) උද්ධෘත අතුරෙන් **'සතරක්'** තෝරා ගෙන ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට ද (උ) හා (ඌ) ප්‍රශ්නවලට ද උත්තර සපයන්න.

(මේ ප්‍රශ්නවලට උත්තර ලිවීමේදී **වර්තමාන ලේඛන ව්‍යවහාරයම** යොදා ගන්න.)

(අ) නැවත කර්මාන්තය නිමවා දුන් කල මිලත් දිය යුතු ය. එසේ කලට ආබරණයෙන් හා කළ මිලයෙන් කැටි ව බොහෝ වස්තුත් වියදම් වෙයි. දන්නා නොදන්නා තමා ම කරන කලට වියදම් වන දෙයක් නැත්තේ වේ දැ'යි බොහෝ සිතිවිලි සිතා තුමූ ම රත්රන් හැරගෙන අකුරු ලියන සේ නොදන්නා කෙනෙකුන් පත්වල හිරි අඳනා සේ කුණ්ඩලාභරණ සේ තළාපියා දූන්හ. ඒ කුණ්ඩලාභරණය උරුවටු ආදී වූ සූක්ෂ්ම කර්මාන්ත නැති හෙයින් මටසිලුටු විය. එසේ හෙයින් කුමාරයන්ට නම් තබන්නෝ මට්ටකුණ්ඩලී නම් තුබූහ. ඒ කුමාරයන් සොළොස් හැවිරිදි අවස්ථාවෙහි පාණ්ඩුරෝග ඇති විය. එක් දවසක් කුමරුන්ගේ මෑණියෝ බමුණානන්ට වස්තු ලෝභයෙන් ඊ අවස්ථාවක් නැතත් තුමූ පුතණුවන්ගේ සැටිය දැක බමුණාණන් බණවාලා "තොපගේ පුතණුවන්ගේ සැටි පෙවෙත් නපුර. උන් තමන් නොකියතත් ලෙඩක් දුකක් ඇත්තා සේය. ඊට නිසි පිළියම් දන්නා කෙනෙකුන් ගෙනවුත් පිළියමක් කරව"යි උන්ගේ අදහස් ආබරණය කළ ලෙසින් ම නොහැඟුණා සේ කිවුය.

(1) බොහෝ වස්තු වියදම් වන්නේ කෙසේද?

(2) කුණ්ඩලාභරණය සකස් කළ ආකාරය මෙහි දක්වා ඇත්තේ කෙසේද?

(3) 'ඒ කුමාරයන් සොළොස් හැවිරිදි අවස්ථාවෙහි .........' මෙය ලිහිල් බසින් ලියන්න.

(4) 'උරුවටු' යන්නට කෙටි විවරණ සපයන්න. (ලකුණු 04)

(ආ) එකල රජගහ නුවර බිම්බිසාර රජ්ජුරුවෝ එපවත් අසා "චක්‍රවර්තීන් උපදනා වූ අමිතභෝගී සිටුවරුන්ගෙන් හා අටළොස් කෙළක් කුලයෙන් ශෝභාවත් වූ මාගේ මෙබඳු වූ ශ්‍රී නගරයක් විශාලා මහනුවරට එක ගණිකාවක නිසා අඩුවනු නො යෙදෙයි. මාගේ නුවරද වේශ්‍යාවකගෙන් ශෝභාවත් කරවමි"යි සිතා එනුවර මුළුල්ලෙහි රූපත් වූ ස්ත්‍රීන් පරීක්ෂා කොට සාලවතී නම් කුමාරිකාවක උතුම් රූ ඇති සේ අසා ඇය රජාඞ්ගණයට ගෙන්වා මුළු නුවර වැස්සන් රැස්කොට මෙපවත් කියා 'අපි ම ඇති කරම්හ'යි මන්ත්‍රණය කොට නුවර වැසියන්ගෙන් මසුරන් දෙලක්ෂයක් හා තමන්ගෙන් ලක්ෂයක් හා මෙසේ තුන්ලක්ෂයක් මසුරන් හා වේශ්‍යාවන්ට සුදුසු වූ රුවන් පලඳනා හා පරිවාර ජනයන් හා උයන් පොකුණු බත්ගම් ආදි වූ නොයෙක් සැපත් හා සත්බුමු මහ පායකුදු දී එනුවරට අග්‍ර වූ වේශ්‍යා තනතුර දී දවස දෙදහසක් දී ඇය කරා පුරුෂයන් වදනා සේ නියෝග කොට අම්බපාලි නම් ගණිකාවට දියුණු වූ ස්ථානාන්තර හා සම්පත් දූන්හ. එතැන් පටන් සාලවතී නම් ගණිකා ද එනුවර නැඟූ ධජයක් සේ ප්‍රසිද්ධ වූව.

(1) රජගහ නුවර ශෝභාවත් කළ කුල ගණන කොපමණද?



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources
iexamhub
CamScanner

(2) වෛශ්‍යා තනතුර ඇති කිරීමට වියදම් කළෝ කවරහුද?

(3) 'සත්බුමු මහ පායකුදු.....' මෙය ලිහිල් බසින් ලියන්න.

(4) 'අමිතභෝගී' යන්නට කෙටි විවරණ සපයන්න. (ලකුණු 04)

(ඉ) "කැණහිල් මාංශ කැටියක් ඩැ ගෙන ගඟ සමීපයට ගොස් අසල යන කලට මත්ස්‍යයෙක් දියෙන් ගොඩට පැනපි ය. කැණහිල් කට තිබූ මාංශ දමා මත්ස්‍යයා ඩැ ගන්ට දිවූ කල මත්ස්‍යයා දියට පැනපි ය. උකුසු මාංශ කැටිය ඩැගත. එකියන සිහාලයා මත්ස්‍යයාත් නොලැබ මාංශ කැටියත් නොලැබ වික්ෂේප ව ගඟ සමීපයෙහි උන් ස්ත්‍රියගේ මුණ බල බලා සිටියේ ය. එවිට එකියන ස්ත්‍රිය මහත් කොට සිනාසී පුවාහ. ඊට ශක්‍රයෝ කියන්නාහු "මෙතැන නැටීමක් ගී කීමක් කෙළි නළුවක් නැතිව මහත් කොට අස්ථානයේ සිනාසුණුයේ කුමකටදැ" යි විචාළේ ය. එවිට ස්ත්‍රී කියන්නී "තොප කටින් ඩැගෙන ආ මාංශ කැටිය මත්ස්‍යයා කමි'යි කටින් දමා මත්ස්‍යයා ඩැගන්ට ගිය කලට මාංශ කැටිය උකුසු ඩැගත. මත්ස්‍යයා දියට පැනපිය. මේ කාරණය දැක සිනාසීමි" කිව. එවිට ශක්‍රයෝ කියන්නාහු "තොප මට සිනාසෙන්ට කාරණා කිම්ද? තොපගේ පළමු පිසවා කෑ සමණනුත් නැතිව අලුත් සමණනුත් නැතිව උභය භ්‍රෂ්ටව ඉඳිනා තෙපි මට නින්දා කියා සිනා සෙන්නේය" යි ශක්‍රයෝ නින්දාකොට බිණුහ. ඊට ස්ත්‍රී කියන්නී "පළමු මෙසේ වූ නොකටයුත්ත කොට මෙසේ වූ දුකකට පැමිණියෙමි. ඉනික්බෙ පතිව්‍රතා ධර්මය විනා මෙසේ වූ දෙයක් නොකරව" යි කිව. ශක්‍රයෝත් "පතිව්‍රතා ධර්මය විනා මෙසේ වූ නොකටයුත්තක් නොකරව" යි අවවාද දී 'දෙව්ලොවට ගියාහ' යි වදාරා සර්වඥයන් වහන්සේ චතුස්සත්‍යය ප්‍රකාශ කොට මේ චුල්ලධනුද්දර ජාතකය නිමවා වදාළ සේක.

(1) ස්ත්‍රිය පවසන සිනාසීමට හේතු කවරේද?

(2) ශක්‍රයා ස්ත්‍රියට ලබා දුන් අවවාදය කුමක්ද?

(3) "උභය භ්‍රෂ්ටව ඉඳිනා තොපි මට නින්දා කියා සිනාසෙන්නේ ය" යන උද්ධෘතය ලිහිල් බසින් ලියන්න.

(4) "චතුස්සත්‍යය" යන්නට කෙටි විවරණ සපයන්න. (ලකුණු 04)

(ඊ) එකල්හි එනුවර යට කී උද්දාල බ්‍රාහ්මණයා රජ්ජුරුවන්ට නුදුරු ව බඳපුටුවෙක පලසක් මත්තෙහි හුන්නේ ය. ගාන්ධර්ව බ්‍රහ්මණයාද රජහු වැඳ අවසරගෙන වීණා ගායනා කෙරෙමින් ස්වර්ණතිලකාව හා සමඟ එකත්පස් ව හුන්නේ ය. එකෙණෙහි තමා පියාණන් පිටිපස්සෙහි හුන්නා වූ ස්වර්ණතිලකා තොම උද්දාල බ්‍රාහ්මණයාණෝ නම් කවුරු දැ'යි විචාරා තෙල හදුපිය මත්තෙහි හිඳිනාහු ඒ බ්‍රාහ්මණයාණෝ යැ'යි කී කල්හි තමාගේ නිලුපුල් පෙති දෙකක් හා සමාන නිර්මල වූ සුනිල් නෙතින් ඔහු බලන්නී, කොඳ කැකුළ මෙන් සුදු සිනිඳු දත් පෙළෙහි මනහර සුදුරසින් භින්නවර්ණ වූ අතිරක්ත අධරයුග්මය පොපි දෙවා මඳ මඳ සිනා පහළ කෙරෙමින් උද්දාල බ්‍රාහ්මණයා මුහුණ බලා තමා පෙරව ගෙන උන් පලස මඳක් පහකොට ශරීරප්‍රභා විහිදුවාලුව. හිරුරැස් කලඹක් වැනි ඒ ශරීරාලෝකය දැක උද්දාල බ්‍රාහ්මණයා ඉතා ආශ්චර්යවත් ව කවර ආලෝකයෙක් දෝ හෝ' යි විස්මය පත්ව බලනුයේ ස්වර්ණතිලකාව දැක කාමයෙන් උමතුව මහත් වූ ශෝකයෙන් දහගත ශරීර ඇති ව හුණු වූ ආශ්වාස ප්‍රශ්වාසයෙන් පිරුණු මුඛ නාසිකා හා කඳුළුධාරාවෙන් තෙත් වූ නේත්‍ර ඇතිව විසංඥ විය.

(1) ස්වර්ණතිලකා උද්දාල බමුණාගේ අවධානය දිනා ගැනීමට සිදු කළේ කුමක් ද?

(2) ස්වර්ණතිලකා දුටු උද්දාල බමුණාට සිදු වූයේ කුමක් ද?

(3) "තෙල හදුපිය මත්තෙහි හිඳිණාහු" යන උද්ධෘතය ලිහිල් බසින් ලියන්න.

(4) "අතිරක්ත අධරයුග්මය" යන්නට කෙටි විවරණ සපයන්න. (ලකුණු 04)

(උ)

| | | | |
|---|---|---|---|
| සවසත | කුලුණැසින් | ඔහු තෙද | දිවසකර |
| සව් සත තියුණු | නැණැසින් | දිලිහෙන විකුම් | ගිරි සිර |
| නිති දක්නා | විසින් | පෙර සිටි රහ | නො හැර |
| එරජමය යුතු වූයෙ | යුගැසින් | සිටි ද පර රද යස | තුසරකර |



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
CamScanner

(1) සවසත තියුණු නැණසින් යන පාදයේ සවසත යනු කුමක්ද?

(2) කරුණා ඇසින් බැලුවේ කවුරුන් දෙසද?

(3) "ඔහු තෙද දිවස කර - දිලිහෙන විකුම ගිරිසිර" මෙම උද්ධෘතය ලිඛිල් බසින් ලියන්න.

(4) "තුසරකර" යන්නට කෙටි විවරණ සපයන්න. (ලකුණු 04)

• (ඌ) සහ (එ) ප්‍රශ්න දෙකටම උත්තර සපයන්න.

(ඌ) පහත සඳහන් උද්ධෘත අතුරෙන් හතරක අවස්ථා සම්බන්ධය දක්වන්න.

(1) "මාත් ස්වාමිනි ඒ උගන්වා වදාළ මැනව"

(2) " සොඳුර තොප ඉණ තිබූ ඉණකඩින් තොප පලන් ආභරණ ගලවා බැඳ දී ලන්න"

(3) " යම්තාක් මාගේ ස්වාමි පුත්‍රයාණෝ ජීවත් ව ඉඳිද්දී ඒ තාක් කල් ම මට අතික් ගෙහිමියෙක් නම් නැත."

(4) "ඥානවන්තයන් සිතුව මනා සිතුවිල්ලෙක් ම ය"

(5) "ඔය සුදු මහත්තුරුන්ගේ නෝනලාට ලැජ්ජා බය නැ කියන එක ඇත්තක්ද?

(6) "නෝනාගෙන් ඉංග්‍රිසි ටිකක් ඉගෙන ගන්න බැරියැ"

(7) "අප දෙදෙනාට වියෝ වන්න - සිදු නොවේ ද බෝ විගසින්" (ලකුණු 3 x 4 = 12)

(එ) හෙළ හවුලේ කවීන්ගේ භාෂා භාවිතය කෙරෙහි අවධානය යොමු කරමින් පහත සඳහන් පද්‍ය පන්තිය පිළිබඳ රසාස්වාදයක් කරන්න.

මල් ගොමු ගුමු ගුමු ගන්වන්නී
මී වදවලැ පැණි පුරවන්නී
කුරුලු සරින් කන් පිනවන්නී
මුළු ලෝ උයනක් කරවන්නී

ජම්බු ගහට රත පොරවන්නී
බක් මී ගහ කහ අන්දන්නී
අඹ දලු ළා රත තවරන්නී
ලෝ කත විසිතුරු කැරලන්නී

එරබදු පැහැයෙන් දූලවන්නී
නා ගස් සුවඳින් බැඳලන්නී
විලේ නෙලුම් මල් පොබයන්නී
නෙත ගිය ගිය අත පණවන්නී

ගමේ මැ පුහුලන් ඉදවන්නී
සොරුන් බවට වවුලන් ලන්නී
නෙතැනැ වවුලු පළවල් දෙන්නී
ගම් දරුවන් හට වැඩ දෙන්නී

මල්සර හට හී සපයන්නී
යොවුනන් සිත් ඉන් බැඳලන්නී
දෙක දෙක එක්කැර ඇඳන්නී
තොම්ලේ කපුකම කරවන්නී

වෙන් වූවන් සිත කලඹන්නී
පරණ තරහ හැම යට ලන්නී
ආයෙත් එකමුතු කරවන්නී
පවුල් අවුල් විසඳාලන්නී

කොල්ලන් කෙල්ලන් බැඳලන්නී
මහලු සිතෙත් කෙළි පිසි ලන්නී
ගෙයි ගෙයි බක් වෙස් ගන්වන්නී
අවුරුදු කිරිබත උයවන්නී

දස දෙස සුවඳින් බැඳලන්නී
ගතට සිතට නව පණ දෙන්නී
කඹුරට ආසිරි සලසන්නී
රට වටැ සොම්නස ගෙනැ යන්නී

සිසිර කුමරි පස්සට ලන්නී
ගිම් කුමරිට පෙරටුවැ එන්නී
දිනිසුරු කුමරුට අත දෙන්නී
ලොවට මැ මඟුලක් සලසන්නී

(ලකුණු 12)

02. (අ) 'කුරුණෑගල - දඹදෙණිය යුග සිංහල ගද්‍ය සාහිත්‍යයේ නවෝදයක් සනිටුහන් කළ කාල වකවානුවකි' මේ පිළිබඳ ඔබේ අදහස් දක්වන්න. (ලකුණු 07)

(ආ) 'තීරණාත්මක මොහොතක බුද්ධිමත්ව ක්‍රියා කළ යුතුබව සද්ධර්මරත්නාවලී කතුවරයා අවධාරණය කරයි.' නියමිත කතා ඇසුරෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 08)

**නැතහොත්**

'අවස්ථානුකූලව බුද්ධිමත් තීරණ ගැනීමේ අවශ්‍යතාව ජාතක කථාවලින් මැනවින් පෙන්වා දෙයි.' නිර්දිෂ්ට කථා ආශ්‍රයෙන් විමර්ශනය කරන්න. (ලකුණු 15)

03. 'ආශාවන් හා හැඟීම්වලට වහල්වීම නිසා මිනිසුන් මුහුණ දෙන ඛේදනීය අත්දැකීම ඉතා රසවත්ව ඉදිරිපත් කිරීමට සද්ධර්මාලංකාර කතුවරයා සමත්ව ඇත.' මේ කියමන උදාහරණ සහිතව විමසන්න. (ලකුණු 15)

**නැතහොත්**

'උත්සාහවන්තව හා කැපවීමෙන් කටයුතු කිරීමෙන් තම අපේක්ෂාවන් ජයගත හැකිබව පූජාවලී කතුවරයා මැනවින් පෙන්වා දී ඇත.' නියමිත කතා ඇසුරෙන් උදාහරණ සහිතව විස්තර කරන්න. (ලකුණු 15)

04. 'විවිධ අවස්ථාවල පවත්නා විචිත්‍රත්වය දැක්වීමෙදී යෝග්‍ය පරිදි වීරිත වෙනස් කිරීම නිසා ගුත්තිල කාව්‍යය විශිෂ්ට පද්‍ය නිර්මාණයක්බවට පත් වී ඇත.' නිර්දිෂ්ට පද්‍ය ආශ්‍රයෙන් පැහැදිලි කරන්න. (ලකුණු 15)

05. 'සමාජයේ පවත්නා විවිධ විශ්වාස හා ඇදහිලි නිසාත් පාරිසරික හේතු නිසාත් පීඩාවට පත්වන අසරණ ජන කොට්ඨාසයක් පිළිබඳ බැද්දේගම නවකතාවෙන් ඉදිරිපත් කෙරේ.' නිදසුන් දෙමින් සනාථ කරන්න. (ලකුණු 15)

06. චරිතවලට ගැළපෙන ලෙස භාෂාව යොදා ගැනීමට කෙටිකතා රචකයන් සුවිශේෂ දක්ෂතාවක් දක්වා ඇති අයුරු නියමිත කෙටිකතා තුනක්වත් ආශ්‍රයෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 15)

07. ප්‍රේමයේ රමණීයත්වයත් එහි කටුක වේදනාවත් කලාත්මක ලෙස ප්‍රතිනිර්මාණය කිරීමට නූතන කවීන් සමත් වී ඇති ආකාරය නූතන පද්‍ය සංග්‍රහයේ පද්‍ය පන්ති තුනක්වත් නිදසුන් කොට ගනිමින් පහදන්න. (ලකුණු 15)

08. 'පෙමතො ජායති සොකො' නාට්‍යය වඩාත් රසවත් දෘශ්‍ය කාව්‍යයක්බවට පත් වන්නේ එහි උපයුක්ත ගීතවත් භාෂාව හේතුවෙනි.' නාට්‍ය පෙළ ඇසුරෙන් විමසන්න. (ලකුණු 15)



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources
CamScanner

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

# තෙවන වාර පරීක්ෂණය
# மூன்றாம் தவணைப் பரீட்சை - 2026
# Third Term Test

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade } 13 | විෂය / பாடம் / Subject } සිංහල | පත්‍රය / வினாத்தாள் / Paper } II | පැය / மணித்தியாலம் / Hours } 3 |

| | |
|---|---|
| අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි<br>மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்<br>Additional Reading Time - 10 minutes | අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත්, උත්තර ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න. |

**උපදෙස් :**

- I කොටසෙහි සියලුම ප්‍රශ්නවලට උත්තර සපයන්න.
- එක් එක් ප්‍රශ්නයට වඩාත්ම ගැළපෙන උත්තරය තෝරා ගෙන එයට හිමි අංකය වරහන් තුළ ලියන්න.

## I කොටස

01. 1.1 කණ්ඨජ අක්ෂර පමණක් අයත් වරණය තෝරන්න.

(1) ක, ඛ, ග, ඝ, ඞ (2) ග, ජ, ඩ, ද, බ (3) ක, ග, ඩ, ශ, හ
(4) ත, ථ, ද, ධ, ණ (5) ශ, ෂ, ස, හ, ෆ (......)

1.2 නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පද පේළිය තෝරන්න.

(1) නෂ්ඨාවශේෂ, ප්‍රත්‍යාර්ථ, දෘෂ්‍ය කාව්‍ය, සණ්ඨාරය, ධාරාණිපාත
(2) නෂ්ටාවශේෂ, ප්‍රත්‍යයාර්ථ, දෘශ්‍ය කාව්‍ය, සණ්ටාරය, ධාරානිපාත
(3) නශ්ටාවශේෂ, ප්‍රථ්‍යයාර්ථ, දෘස්‍ය කාව්‍ය, ගණ්ටාරය, දාරානිපාත
(4) නෂ්ඨාවසේශ, ප්‍රත්‍යයාර්ථ, දූෂ්‍ය කාව්‍ය, ගන්ටාරය, ධාරානිපාථ
(5) නශ්ඨාවශේෂ, ප්‍රත්‍යයාර්ථ, දෘශ්‍යය කාව්‍ය, සන්ඨාරය, ධාරාණිපාථ (......)

1.3 අකාරාදි පිළිවෙළ අනුව නිවැරදිව ලියා ඇති පද පේළිය තෝරන්න.

(1) ලෝවැඩසඟරාව, ලෝකෝපකාරය, ජිනබෝධාවලිය, ඥානාර්ථ ප්‍රදීපය, සුබෝධාලංකාරය
(2) ඥානාර්ථ ප්‍රදීපය, ජිනබෝධාවලිය, ලෝකෝපකාරය, ලෝවැඩසඟරාව, සුබෝධාලංකාරය
(3) ජිනබෝධාවලිය, ඥානාර්ථ ප්‍රදීපය, ලෝකෝපකාරය, ලෝවැඩසඟරාව, සුබෝධාලංකාරය
(4) සුබෝධාලංකාරය, ලෝකෝපකාරය, ලෝවැඩසඟරාව, ජිනබෝධාවලිය, ඥානාර්ථ ප්‍රදීපය
(5) ලෝකෝපකාරය, ලෝවැඩසඟරාව, ඥානාර්ථ ප්‍රදීපය, සුබෝධාලංකාරය, ජිනබෝධාවලිය (.....)

1.4 පහත සඳහන් ප්‍රකාශ අතුරින් නිරවද්‍ය ප්‍රකාශය තෝරන්න.

(1) රකාරාංශය මූර්ධජ අක්ෂර සමගම යෙදිය යුතුයි.
(2) රකාරාංශය ස්වරයකට පසුව යෙදේ.
(3) රකාරාංශය ශුද්ධ ව්‍යඤ්ජනයකට පසුව යෙදෙන 'ර' අක්ෂරය වෙනුවට යෙදෙයි.
(4) රකාරාංශය රේඵය වෙනුවටද යෙදිය හැකිය.
(5) රකාරාංශය අනුස්වාරය යෙදෙන වචනවල යෙදිය නොහැකිය. (......



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
CS CamScanner

1.5 එකිනෙකට අනුරූප වන සේ වචන යුගල යෙදී ඇති වරණය තෝරන්න.

(1) විශේෂ දොරටුව, සඳුන් සුවඳ, කාර්ය සාධක, කාව්‍ය චින්තා
(2) පළාත් විමර්ශන, සංඝ සමුළුව, භේද භින්න, නාද ශික්ෂණ
(3) මැටි කර්මාන්තය, අත් පහුර, නිල් ආකාශ, දේශපාලන රැස්වීම
(4) නැවුම් අද්දැකීම, නාට්‍ය පිටපත්, ගායක කැල, චාමර නැටුම
(5) සඳ රශ්මි, නේත්‍ර පූජා, වාසනා චක්‍රය, රියැදුරු ආසනය (......)

1.6 තත්සම පද පමණක් යෙදී ඇති වරණය තෝරන්න.

(1) ත්‍යාග, ජාල, නාග, රංග
(2) සහන, යොවුන්, සතර, චාප
(3) ඉසුරු, පරණ, දෙවිඳු, මිතුරු
(4) මහාර්ඝ, බාල, තෙර, නිධාන
(5) දින, මෙත්, මැසි, සරණ (......)

1.7 තද්භව පද පමණක් ඇතුළත් වරණය තෝරන්න.

(1) සරඹ, සහස්‍ර, වස, පණ
(2) විළඳ, ඇස, සෙමෙර, වළලු
(3) නැව, දෙව්, කෘත, අඳුන
(4) ගහ, නියඟ, ප්‍රේම, දරුණු
(5) සියුම්, උණුසුම්, පැතුම්, තිර්ථ (......)

1.8 විශේෂණ, අන්‍යාර්ථ, අව්‍යය, විභක්ති යන සමාසවලට අයත් පද පිළිවෙළින් දක්වා ඇති වරණය තෝරන්න.

(1) පොල්තෙල්, දසරාජධර්ම, විදුරත්, අනෞචිත
(2) විදුරත්, අනෞචිත්‍ය, පොල්තෙල්, දසරාජධර්ම
(3) අනෞචිත්‍ය, දසරාජධර්ම, විදුරත්, පොල්තෙල්
(4) දසරාජධර්ම, පොල්තෙල්, අනෞචිත්‍ය, විදුරත්
(5) දසරාජධර්ම, විදුරත්, අනෞචිත්‍ය, පොල්තෙල් (......)

1.9 කෘදන්තයක් නොවන පදයක් අන්තර්ගත වරණය තෝරන්න.

(1) හදාළ, විචාළ, මතුළ, අතුළ
(2) කඩන, දවටන, රඟන, නෙළන
(3) රැව්ලි, කෙඳිරිලි, සැහැලි, වැටිලි
(4) කියමන්, පිසමන්, වියමන්, සිහමන්
(5) මැරූ, දිවූ, තැනූ, සැදූ (......)

1. 10 පහත දැක්වෙන උද්ධෘතවල තද කළු අකුරෙන් මුද්‍රිත පද අයත් ක්‍රියා වර්ග පිළිවෙළින් දක්වා ඇති වරණය තෝරන්න.

"හිමි ගමනක් <u>ගොසින්</u>"
"**කියනුව** දිවාරැය"
"ලැබුණ**ත්** නෙත් යුග දහසක උරුමේ"
"මාහිමියනි බුදු <u>වනු මැන</u> නොවී පමා"

(1) අසම්භාව්‍ය ක්‍රියා, විධි ක්‍රියා, අපර ක්‍රියා, පූර්ව ක්‍රියා
(2) පූර්ව ක්‍රියා, විධි ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, අපර ක්‍රියා
(3) පූර්ව ක්‍රියා, අපර ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, විධි ක්‍රියා
(4) අපර ක්‍රියා, විධි ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, පූර්ව ක්‍රියා
(5) විධි ක්‍රියා, අසම්භාව්‍ය ක්‍රියා, අපර ක්‍රියා, පූර්ව ක්‍රියා (......)

1.11 තද්ධිතයක් නොවන පදයක් අන්තර්ගත වරණය තෝරන්න.

(1) භෞතික, ප්‍රාථමික, නෛතික, කාල්පනික
(2) මාධූර්ය, ධෛර්ය, ඖදාර්ය, කෞශල්‍ය
(3) ගුණවත්, හදවත්, ධනවත්, සුවඳවත්
(4) අද්‍යතන, නූතන, පුරාතන, චිරන්තන
(5) මුදුතා, ජනතා, ශූරතා, විශේෂතා (......)

1.12 උපසර්ගයක් අන්තර්ගත නොවන පදයක් සහිත පද පේළිය තෝරන්න.

(1) සම්මාන, සංකලන, සත්කාර, සද්භාව
(2) නිස්සාර, උද්වේග, පිළිලබ, පරිභෝග
(3) උපහාර, අතික්‍රාන්ත, අපද්‍රව්‍ය, ප්‍රමෝදය
(4) ඔවදන්, විස්තර, දූර්දාන්ත, විභූෂණ
(5) ප්‍රගමනය, සජ්ජන, අභිමාන, සන්තාප (......)



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources
CamScanner

1.13 එකම අර්ථයට අයත් නිපාත පද සමූහයක් අන්තර්ගත වරණය තෝරන්න.

(1) පිණිස, උදෙසා, අරභයා, වෙනුවෙන්
(2) නිබඳ, තුරු, විනා, වූ කලී
(3) දක්වා, කෙරෙන්, නිරතුරු, වනාහි
(4) තැටුව, කෙරෙහි, බැවින්, නැවත
(5) වෙත, පාසා, මිස, හෙයින් (.....)

1.14 '**සිහිති** දරුවන් **උදෙසා** ලියවුණු **පොත්පත්** වර්තමානයේ බහුලව දක්නට ඇත' යන වාක්‍යයේ වචන යෙදී ඇති පිළිවෙළ අනුව තද කළු අකුරින් මුද්‍රිත පද අයත් ව්‍යාකරණ වර්ග නිවැරදිව දැක්වෙන වරණය තෝරන්න.

(1) සමාස, නිපාත, තද්ධිත
(2) නිපාත, සමාස, තද්ධිත
(3) සමාස, තද්ධිත, නිපාත
(4) තද්ධිත, සමාස, නිපාත
(5) තද්ධිත, නිපාත, සමාස (......)

1.15 සමාන ව්‍යාකරණ ලක්ෂණ නිරූපණය කරන ක්‍රියා රූප සහිත වරණය තෝරන්න.

(1) ගියොත්, පැමිණ, තබා, විමසා
(2) එන, බලනු, එව, කියත
(3) විවාලේය, වගුලේය, අතුලේය, මතුලේය
(4) ගයවයි, තවයි, දුවයි, බලවයි
(5) දකිනුව, ඇමතුව, යද්දී, අස (......)

1.16 සමාසයක් නොවන පදයක් අන්තර්ගත වරණය තෝරන්න.

(1) සුරසැවු, ජනප්‍රිය, කුපුරිස්, සඳරැස්
(2) සවකැද, පසැස්, සිහිනිහ, අනුරූප
(3) ගංදිය, යවදිව, ගවුම්පොඩි, තුන්දොර
(4) සවත්, ගිනැවුම්, සුවතා, මව්ගුණ
(5) දිවිසම්, සතපා, මලවි, සුරමඟ (......)

1.17 එකම වර්ගයට අයත් සන්ධි පද ඇතුළත් වරණය තෝරන්න.

(1) වියවුල්, දෙයාකාර, සිවුරැස්, සිවුරඟ
(2) අංගෝපාංග, පරමායුෂ, පුනරුදය, කම්මල
(3) වරහන, කර්මානුරූප, ගමනාන්තය, වම්මුතු
(4) නීත්‍යනුකූල, සිත්තම්, පරෝපකාර, ගංදැළ
(5) රෝගාබාධ, මල්ලිත්ත, මුලාසනාරූඪ, ගෙවුයන (......)

1.18 ව්‍යාකරණානුකූලව නොගැළපෙන පදයක් සහිත වරණය තෝරන්න.

(1) බැලුවේය, ලිව්වෝ, රැක්කෝ, දැරුවේ
(2) එව, පරිදි, විලස, අයුරු
(3) ඇතැමෙක්, සමහරෙක්, අයෙක්, කෙනෙක්
(4) සරණවි, මරරූප, ජලධර, කලගොස්
(5) සිහිලළ, වහළ, ඉහළ, පහළ (......)

1.19 ව්‍යාකරණානුකූලව නිවැරදි වාක්‍යය තෝරන්න.

(1) නිලධාරිහු කාර්යාලයට පැමිණ නැත.
(2) දක්ෂ කෙටිකතාකරුවෙකු වූ මහගමසේකර මහතා දක්ෂ චිත්‍ර ශිල්පියෙකුද විය.
(3) ප්‍රවීණ ගායකයෝ සිවුදෙනෙක් විනිශ්චය මණ්ඩලයේ සිටිති.
(4) සියලු රටවැසියෝ නීතියට ගරු කළ යුතු ය.
(5) ඕතොමෝ දරුවන්ට කාරුණික මවක් වූහ. (......)

1.20 ලේඛන ව්‍යවහාරයට වඩාත් සුදුසු වාක්‍යය සහිත වරණය තෝරන්න.

(1) අයියෝ! අපිට වෙච්ච දෙයක්.
(2) ගුරුතුමා මාව අගය කළේය.
(3) මේ දවස්වල අපිට හොඳටම කරදරයි.
(4) ක්‍රීඩකයෝ කියන්නේ හොඳ සවියක් ඇති අයනේ.
(5) නංගි සන්ධ්‍යා කාලයෙහි මට ඇසෙන පරිදි ගීයක් ගැයුවාය. (......)

(ලකුණු 1 X 20 = 20)



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources
iexamhub
CamScanner

## II කොටස

මෙම කොටසින් 2,3 ප්‍රශ්න ඇතුළුව ප්‍රශ්න හතරකට පමණක් උත්තර ලියන්න.

02. (අ) පහත සඳහන් පාඨය කියවා අසා ඇති ප්‍රශ්නවලට උත්තර ලියන්න.

සිංහලය සංස්කෘත පාලි වැනි භාෂා සමඟ සමීප සම්බන්ධතාවක් ඇති නමුත් එය සකු, මගධ බස්වලින් පහළ වූවක් ද නැතහොත් එකී භාෂාවන් හා සමාන්තර වර්ධන ඔස්සේ විකාශනය වූවක් ද යන්න එකහෙළා ම කීම අසීරු ය. සිදත් සඟරාවේ ඇති දුබලතාවනට ප්‍රධාන හේතුව වන්නේ මෙම ඓතිහාසික සම්බන්ධය ගැන පැවති පූර්ව නිගමනයන් නිසා බව සමහරුන්ගේ මතයයි. ඊ.යිපියල් තෙන්නකෝන් මහතා මේ ගැන පවසා ඇත්තේ "මෙහි පිළිවෙළ අවුල් වී යාමට ප්‍රධාන ම හේතුව ලෙස පෙනෙන්නේ සිදත් සඟරාකරුවනුත් සෙසු පඬුවන් සේ ම සිංහලය මගධ සකු යන දෙබසින් පහළ වූවක් යන හැඟීම ඇතිව සිටීම" යි යනුවෙනි.

එහෙත් සිදත් සඟරා කතුවරයා එබඳු මතයක් දැරුවේ නම් සිංහල හෝඩිය ද සංස්කෘත හෝඩිය ම ලෙස දක්වන්නට ඉඩ තිබිණි. මන්ද යත් මිශ්‍ර සිංහල ගද්‍ය ව්‍යවහාරයෙහි සංස්කෘත අක්ෂර භාවිත වූ බැවිනි. සියබසට වියරණයක් ලිවීමට එළැඹෙන සිදත් කතුවරයා එසේ කරන්නේ එය යම් ස්වාධීන ලක්ෂණ ඇති භාෂාවක් ලෙස සලකාගෙන ය. මෙහි යථා තත්ත්වය පරීක්ෂා කරන විට පෙනී යන්නේ සංස්කෘත භාෂාවේ බලපෑම ඔස්සේ යටපත් වෙමින් තිබූ හෙළ බසේ ලක්ෂණ පහදා දීම කතුවරයාගේ අරමුණ වූ බවයි. එම ලක්ෂණ වඩාත් ආරක්ෂිතව පැවතියේ පද්‍ය ව්‍යවහාරයෙහි ය, හෙවත් කවි ලැකියෙහි ය. කවි ලැකියෙහි වියරණ ලකුණු විධිමත්ව පිරික්සා බැලීම සම්බන්ධයෙන් විමසීමේදී සිදත් සඟරාවේ කෙතරම් දුර්වලතා පැවතිය ද කතුවරයාගේ මූලික ධාරණාව වූයේ සංස්කෘත මිශ්‍ර ගද්‍ය ව්‍යවහාරය සලකා බැලීම නොව, එම ආභාසයෙන් කැළැල් නො වූ හෙළ බස් ලකුණු කියා පෑමය. ඒ අනුව විසිවැනි සියවසේ කුමරතුඟුවන් සංස්කෘත ආධිපත්‍යයෙන් සිංහලය මුදවා ගැනීමට ගත් උත්සාහයට සමාන උත්සාහයක් තෙළෙස්වැනි සියවසේ සිදත්කරුවෝ ද යෙදූණ හ. එහෙයින් සිදත් කතුවරයා සංස්කෘතය ගැන සිහි කරමින් සිංහල ව්‍යාකරණ රීති සකස් කළ බව ප්‍රකාශ කිරීම යුක්ති සහගත නොවේ.

(i) පාඨයේ සඳහන් සිංහල භාෂාවේ සම්භවය පිළිබඳ මතවාද දෙක මොනවාද?

(ii) සිංහල ගද්‍ය ව්‍යවහාරය කෙරේ සිදත් කතුවරයා සැලකිලිමත් නොවීමට හේතුව කුමක්ද?

(iii) මෙම ලේඛකයා සිතන පරිදි සිදත් කතුවරයාගේ අරමුණ මෑත කාලයෙහි දක්නට ලැබුණු බවට ඉදිරිපත් කර ඇති සාධකය කුමක්ද?

(iv) සිදත් සඟරාව පිළිබඳ ඊ.යිපියල් තෙන්නකෝන් මහතා දරන මතය බැහැර කිරීමට ලේඛකයා උදව් කර ගන්නා සාධකයක් ලියන්න.

(v) සිදත් කතුවරයාගේ මූලික ධාරණාව ලෙස සැලකෙන කරුණ කුමක්ද?

(vi) සිදත් සඟරා කතුවරයා සංස්කෘතය ගැන සිතමින් සිංහල ව්‍යාකරණ රීති සකස් කළ බව ප්‍රකාශ කිරීම සාධාරණ නොවන්නේ කුමන හේතුවක් නිසාද?

(ලකුණු 2 x 6 = 12)

(ආ) පහත දැක්වෙන උද්ධෘතය කියවා එහි වචන සංඛ්‍යාව තුනෙන් එකක් පමණ වන සේ සාරාංශකොට ලියා සාරාංශය අග වචන සංඛ්‍යාවද සඳහන් කරන්න.

සුවදායි ජීවිතයක් අපේක්ෂාවෙන් ස්වභාවධර්මය අභිභවනය කොට මනුෂ්‍ය සංහතිය විසින් නිර්මාණය කර ගන්නා ලද තාක්ෂණය මිනිසා විසින් මිනිසාට ම එරෙහිව යෙදවීම විසිවන සියවසේ වඩාත් තදින් තහවුරු විය. න්‍යෂ්ටික අවි නිෂ්පාදනය සහ අධිරාජ්‍යවාදී ප්‍රචණ්ඩ යුද්ධ සැලසුම් ද මෙකල අන් සියල්ල අභිභවා ප්‍රමුඛත්වයට පැමිණ ඇත. සමස්ත මානව පැවැත්ම ම බේදවාචකයක්බවට පමුණුවාලන මේ තත්ත්වය කලාවේ විෂය ක්ෂේත්‍රය පාථුලත්වයට පත් කිරීමට හේතු වී තිබේ. අප්‍රිකානු, ඉන්දියානු, වියට්නාම හා පලස්තීන සාහිත්‍ය කෘති මේ සඳහා මනා නිදසුන් සපයයි. මෙහි ම ප්‍රතිපක්ෂය ගතහොත් මානුෂික පැවැත්මෙහි ද එහි ප්‍රතිඵල වශයෙන් සාහිත්‍යයේ හා කලාවේ ද විනාශ සිදු කිරීමට ක්‍රියාත්මක වනු ඇත්තේ ද මේ වෛෂයික පදනම ම ය. මානව සංහතිය



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources
CamScanner

පාරිවිනලයෙන් අතු ගා දමා දේශ දේශාන්තරයන් තම තමන් අතර බෙදා හදා ගැනීමට ලොව මහ බලවතුන් සැලසුම් කරන යුද්ධෝපායන්ගේ න්‍යෂ්ටිය ලෙස තාක්ෂණය ම ක්‍රියාත්මක වෙයි.

තාක්ෂණය මානව සංහතියේ හා කලාවේ වර්ධනය සඳහා ඉටු කර ඇති එමෙන් ම ඉටු කරන්නා වූ මෙහෙවර අනුපමේය ය. එහෙත් තාක්ෂණය මහා සැලසුම්කරණයකින් යුක්ත කොට ලක්ෂ සංඛ්‍යාත මහජනතාවගේ උරුමයක්බවට පත් කරන තෙක් එයට විලංගු ලා සිර අඩස්සි කළ ලෙසකින් පවතියි. මනුෂ්‍ය ඝාතන ද ඒ සඳහා ඇති දුෂ්ට සැලසුම් ද සුණුවිසුණු කොට මහජනයාට තාක්ෂණයේ විපුල ඵල නෙලා ගත හැකි වන්නේත් එය වඩ වඩාත් උචිත මට්ටම කරා වර්ධනය කළ හැකි වන්නේත් එහි පසු ගමන්කරුවකු වන සාහිත්‍යයේ හා කලාවේ පුනර්ජීවනයක් ඇති කළ හැකි වන්නේත් තාක්ෂණය බැඳ දමා ඇති යදම් ලිහා බහුජන අයිතියට පවරා මානව ප්‍රගතිය ඒකායන අරමුණ කොට ගත් විද්‍යාත්මක සැලසුම්කරණයකට භාජන කිරීමෙන් ම පමණි.

(ලකුණු 13)

03. දී ඇති මාතෘකාවලින් එකකට අදාළව **වචන 300-350** අතර වන සේ විශ්ලේෂණාත්මක රචනාවක් ව්‍යාකරණානුකූලව ලියන්න.

(i) ජනමාධ්‍ය සඳහා ආචාර ධර්ම පද්ධතියක අවශ්‍යතාව.

(ii) සාරධර්ම සපිරි සමාජයක් බිහිකිරීම උදෙසා ගත හැකි ක්‍රියාමාර්ග.

(iii) සංචාරක කර්මාන්තය දියුණු කිරීමට ගත යුතු ක්‍රියා මාර්ග.

(iv) විදුලි පරිභෝජනය කළමනාකරණය කර ගැනීමේ අවශ්‍යතාව.

(v) ස්වාභාවික ආහාර පරිභෝජනයේ වැදගත්කම.

(vi) රැකියා වියුක්තිය අවම කර ගැනීමට වෘත්තීය අධ්‍යාපනයෙන් ලැබෙන පිටිවහල. (ලකුණු 25)

04. (අ) පහත සඳහන් වාක්‍යවල සදොස් තැන් ඇතොත් නිදොස් කොට ලියන්න.

(i) දක්ෂ රංගන ශිල්පියෙක් වූ ජයලත් මනෝරත්න මහතා ප්‍රවීණ නාට්‍ය රචකයෙක්ද විය.

(ii) සියලු රටවැසියන් නීතියට අවනත විය යුත්තෝය.

(iii) ක්‍රීඩකයෝ පුහුණුවීම්වල යෙදෙනවා අපි දුටුවෙමු.

(iv) අධ්‍යක්ෂවරුන් තිදෙනෙක් සාකච්ඡාවට සහභාගි වූහ.

(v) වගාවන්ට සත්තු හානි කරති' යි ගොවීහු පවසති. (ලකුණු 1 x 5 = 5)

(ආ) පහත සඳහන් වාක්‍ය කර්මකාරකයට හරවන්න

(i) චාරිකාවේදී ඔවුහු අප දැක්කෝය.

(ii) නූතන කෙටිකතාකරුවෝ කාලීන සමාජ ගැටලු තේමා කොට ගෙන කෙටිකතා ලියති.

(iii) ගුරුවරු ඉගැන්වීම් කටයුතුවලදී නව තාක්ෂණික උපකරණ භාවිත කරති.

(iv) ඕ තොමෝ ඉතා මිහිරිව ගීයක් ගැයුවාය.

(v) නීතිඥයෝ උසාවියට විත්තිකරුවන් ගෙන්වති. (ලකුණු 1 x 5 = 5)

(ඇ) නිවැරදි වාක්‍යයක් නිර්මාණය කිරීම සඳහා සුදුසු පද වරහන් තුළින් තෝරා ලියන්න.

(i) උසස් සාහිත්‍ය නිර්මාණ පරිශීලනයෙන් (දරුවන්/දරුවෝ) නිර්මාණශීලි වෙති' යි (විචාරකයෝ/විචාරකයන්) පවසති.

(ii) (දේශප්‍රේමීහු/දේශප්‍රේමීන්) රටේ අභිවෘද්ධියට වැඩ (කරාවී/කරනු ලබයි).



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
CamScanner

(iii) මා විසින් ආරාධිත (අමුත්තන්/අමුත්තෝ) පිළිගනු (ලැබුවෙමි/පිළිගනු ලැබූහ).

(iv) කලා උලෙලෙහි ප්‍රධාන දේශනය ප්‍රබුද්ධ (ලේඛකයෙක්/ලේඛකයෙකු) පැවැත්වූ අතර (කලාකරුවෝ/කලාකරුවන්) විශාල පිරිසක් ඊට සහභාගි වූහ.

(v) (අපි/අප) දුම්රියට නගිද්දී (මිතුරෙක්/මිතුරෙකු) බලා සිටියේය. (ලකුණු 1 x 5 = 5)

05. පහත දැක්වෙන වාක්‍යවල තද කළු අකුරෙන් මුද්‍රිත පදවල ව්‍යාකරණ අංගය දක්වා ඇත. ඒවායෙහි අනු-අංගය දක්වන්න.

(i) **සම්භාෂණයට** පැමිණි **බහුතරයක්** කාන්තාවෝ අලංකාර **වස්ත්‍රාභරණයෙන්** සැරසී සිටියෝය.

(සම්භාෂණයට - උපසර්ග, බහුතරයක් - ප්‍රත්‍යයාර්ථ නාම, වස්ත්‍රාභරණයෙන් - සන්ධි)

(ii) **ගංදෑලෙහි** **තුරුමුදුන්වල** සිටින කොක්කු **නිසොල්මන්ව** සිටිති.

(ගංදෑලෙහි - සන්ධි, තුරුමුදුන්වල - විභක්ති, නිසොල්මන්ව - උපසර්ග)

(iii) ඉහළ **නැඟී** වෙරළ කරා **ඇදෙන** දළ රළ පෙළ බලමින් සංචාරකයෝ **දියකඩනය** අසලට ගියෝය.

(නැඟී - ක්‍රියා, ඇදෙන - කෘදන්ත, දියකඩනය - කෘදන්ත)

(iv) ඉන්ධන අර්බුදය නිසා **උද්ගත** වී ඇති ගැටලු සඳහා කඩිනම් **විසඳුම්** අවශ්‍ය වේ.

(උද්ගත - උපසර්ග, ගැටළු - තද්ධිත, විසඳුම් - කෘදන්ත)

(v) **පෞරාණික** ඇම්බැක්කේ දේවාලයේ **ලීකැටයම්** බලා **කුඩා** දරුවෝ සතුටු වූහ.

(පෞරාණික - තද්ධිත, ලීකැටයම් - සමාස, කුඩාදරුවෝ - විශේෂණ)

(ලකුණු 3 x 5 = 15)

06. (අ) පහත දැක්වෙන වාක්‍යවල හිස්තැනට වඩාත්ම ගැළපෙන පදය වරහන් තුළ දී ඇති පද අතුරෙන් තෝරා ලියන්න.

i. සුභාෂිතය ................. කාව්‍ය ග්‍රන්ථයකි.

ii. තාක්ෂණික ................. සිසුන්ගේ නිර්මාණ කුසලතා හීන කරයි.

iii. ලොව දිනෙන් දින දියුණු වෙයි; නව ............... බිහිවෙයි.

iv. නියමිත .............. අනුව කටයුතු කිරීමෙන් මග අනතුරු වැළකේ.

v. අනුරාධපුර පූජා .............. අයත් ප්‍රධාන ජලාශය නුවර වැවයි.

vi. සත් කෝරළයේ වගා ........... ජලය සැපයෙන්නේ මහ කනදරාව ව්‍යාපාරයෙනි.

(බිම්වලට, උපදෙස්, භූමියට, මෙවලම්, උපකරණ, උපදේශ) (ලකුණු ½ x 6 = 3)

(ආ) පහත දක්වා ඇති පද සන්ධි කර ලියන්න.

i. දන්ත+ආරෝග්‍ය

ii. රත්මල්+ආන

iii. බුද්ධි+ඉන්ද්‍රිය

iv. පුන+උත්

v. දඹ+පිටිය

vi. සුදුසු+ම (ලකුණු ½ x 6 = 3)



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub
CamScanner

(ඈ.) තද කළ අකුරෙන් මුද්‍රිත පදවල විභක්ති නම් කරන්න.

i. උපාසිකාව **මුදු මැදුරෙහි** ප්‍රතිමා පිරිසිදු කළාය.
ii. සොඳුර, **නුඹගේ** ගැයුම ඉතා මනහරය.
iii. දරුවා **පෑනෙන්** අකුරු ලියුවේය. (ලකුණු 1 x 3 = 3)

(ඉ) අවශ්‍ය තැන්වල විරාම ලක්ෂණ යොදා පහත දැක්වෙන කොටස නැවත ලියන්න.

වධකයා කඩුව රැගෙන එන්න ජ්‍යෙෂ්ඨ පුත්‍රයාණෝ පියපත්ව දුවන්නට වන්න ලෙහි අත් ගසා හඬන්නට වන්න මේ දුටු මද්දුම බණ්ඩාරයෝ වහා ඉදිරියට පැන අභීත සිංහස්වරයක් විහිදුවා බිය නොවන්න අයියන්ඩි මැරෙන හැටි මම පෙන්වන්නම් යනුවෙන් පවසා එම්බා ගහලය තාගේ අසිපතින් මාගේ බෙල්ලට ගසා හිස කඳින් වෙන් කරවැයි කියා දං ගෙඩිය මත්තෙහි හිස තබා දුන දරුවෙනි මලමොළකම් නො ව එඩිකම් වඩවු හිත දිනකම් නොව සුරුවිරුකම් වඩවු (ලකුණු 3)

(ඊ.) පහත දැක්වෙන ප්‍රකාශවල එක් එක් ප්‍රකෘති කථනය විකෘති කථනයට හරවා ලියන්න.

i. "ඔබගේ නිදහසට කරුණු කියන්න" යි විනිසුරු විත්තිකරුට නියම කළේය.
ii. "අපොයි! මගේ පේසකම නැතිවුණා" යි මුදලාලි තම හිසෙහි අත තබා ගත්තේ ය.
iii. "මම ඊයේ රෑ නපුරු සිහිනයක් දුටුවෙමි" යි දරුවා මවට පැවසීය. (ලකුණු 1 x 3 =3යි)

07. පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට උත්තර ලියන්න.

සාහිත්‍යය **භාෂාත්මක** විත්‍රමයක් හෙයින් ප්‍රතිභාසම්පන්න **ලේඛකයෙකු** සතු මූලික ගුණාංගයක් විය යුත්තේ භාෂාධිපත්‍යයයි. තමාට අභිමත පරිදි බස හසුරුවා ගැනීමේ **ශක්තියක්** ඔහුට තිබිය යුතුය. සාහිත්‍යකරුවා උපයෝගී කරගන්නා භාෂා **මාධ්‍යයෙහි** තිබියම **විශේෂත්වයක්** ඇත. එම විශේෂත්වය ප්‍රත්‍යක්ෂ කොට ගත හැක්කේ සාහිත්‍යකරුවන්ට අනන්‍යාකාර වූවත් භාෂාව පරිහරණය කරන ආකාරය පරීක්ෂා කිරීමෙනි. සාහිත්‍යයික භාෂාවේ යථා ස්වභාවය වටහා ගැනීම පිණිස විද්‍යාඥයා වචන භාවිත කරන ආකාරයත් සාහිත්‍යකරුවා වචන භාවිත කරන ආකාරයත් සොයා බැලිය යුතුය. විද්‍යාඥයා ලේඛනයක් සම්පාදනය කරන්නේ **විද්‍යාත්මක** සත්‍යයක් ප්‍රකාශ කිරීමේ අරමුණ ඇතිවය. ඒ සඳහා නිශ්චිතාර්ථ දනවන වාංමාලාවක් තෝරා ගනී. හැඟීම් දැනීම් දැනවීම ඔහුගේ අරමුණ නොවේ. ඔහු නිරතුරුව වෑයම් කරන්නේ ඉතා පැහැදිලි වූත් විද්‍යාත්මක වූත් වාංමාලාවක් තුළින් තමා පසක් කොටගත් සත්‍ය ප්‍රකාශ කිරීමටයි.

(i). තද කළ අකුරින් මුද්‍රිත වචන අකාරාදි පිළිවෙළින් ලියන්න.

(ii). මෙහි ඇති උපසර්ග පද තුනක් ලියන්න.

(iii). භාෂාධිපත්‍යය, අනන්‍යාකාර, නිශ්චිතාර්ථ යන පද විසන්ධි කොට ලියන්න.

(iv). මූලික, හැඟීම්, හසුරුවා යන වචනවල යෙදී ඇති පිල්ලම් වෙන වෙනම ලියන්න.

(v). ඡේදයෙහි තිබෙන අඝෝෂ මහාප්‍රාණ අක්ෂර දෙකක් හා ඝෝෂ මහාප්‍රාණ අක්ෂරයක් ලියන්න.

(ලකුණු 3 x 5 = 15)

8. පහත සඳහන් මාතෘකාවලින් තුනක් තෝරාගෙන කෙටි සටහන් ලියන්න.
(i). අපර ක්‍රියා
(ii). ගාත්‍රාදේශ සන්ධිය
(iii). අව්‍යය සමාස
(iv). කුත්සිතාර්ථයෙහි නිපාත
(v). ගෞරවාර්ථ තද්ධිත ප්‍රත්‍යය (ලකුණු 5 x 3 = 15)



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers · Model Answers · Study Resources
iexamhub
CamScanner

# බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අ. පො. ස. (උ. පෙළ) විභාගය-2026
## (තෙවන වාර පරීක්ෂණය)
## 71 - සිංහල I
## ලකුණු දීමේ පටිපාටිය

**සියලු ම හිමිකම් ඇවිරිණි**

**(මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි. මෙය පන්ති කාමරයෙහි ඉගැන්වීම් කටයුතු සඳහා භාවිත කළ හැකි අයුරින් සකසා ඇති බැවින් පිටපතක් සේ මුද්‍රණය කිරීමට හැකි ය යන්න අපගේ අදහස යි.)**



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources

## බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - 13 ශ්‍රේණිය

## තෙවන වාර පරීක්ෂණය

## 71 - සිංහල II පත්‍රය

## ලකුණු බෙදී යාම

මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න අටකින් සමන්විත ය. පළමු ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සැපයිය යුතු ය.

**පළමු ප්‍රශ්නය :** - මේ ප්‍රශ්නය (අ), (ආ), (ඉ), (ඊ), (උ), (ඌ), (එ) යනුවෙන් කොටස් හතකින් (07) සමන්විත ය.

- (අ), (ආ), (ඉ), (ඊ), (උ) අවබෝධය - ලකුණු 16 යි. (4 × 4 = 16 යි)
  (මේ කොටස් පහෙන් හතරකට (04) පමණක් පිළිතුරු සැපයිය යුතු ය.)
- (ඌ) අවස්ථා සම්බන්ධය - ලකුණු 12 යි. (3 × 4 = 12 යි)
  (i, ii, iii, iv, v, vi, vii මේ කොටස්වලින් අවස්ථා සම්බන්ධ හතරකට (04) පමණක් පිළිතුරු සැපයිය යුතු ය.)
- (එ) රසාස්වාදය - ලකුණු 12 යි.
  (01) ප්‍රශ්නයට මුළු ලකුණු - 16 + 12+ 12 = 40 යි.

අංක 02 සිට 08 තෙක් ප්‍රශ්න නිර්දිෂ්ට ග්‍රන්ථ ඇසුරෙන් සකසා ඇත. ඒ අතුරෙන් හතරකට (04) පිළිතුරු සැපයිය යුතු වේ. එක් ප්‍රශ්නයකට ලකුණු 15 බැගින් ලකුණු 60කි. ( 04 වන ප්‍රශ්නය (අ), (ආ) යනුවෙන් කොටස් දෙකකි. (අ) කොටසට ලකුණු 07කි. (ආ) කොටසට ලකුණු 08කි)

### අභිමතාර්ථ

### I පත්‍රය

අ. පො. ස. (උ. පෙළ) විභාගයට පෙනී සිටින විද්‍යාර්ථීන් සතු ව පවතින:

- සම්භාව්‍ය සිංහල (නිර්දිෂ්ට) ගද්‍ය හා පද්‍ය කෘති කියවා අවබෝධ කර ගැනීමේ ශක්‍යතාව හඳුනා ගැනීම ද
- නූතන ගද්‍ය - පද්‍ය හා කාව්‍ය නිර්මාණ රස විඳීම හා තදනුබද්ධ විචාරාත්මක දෘෂ්ටිය කෙබඳුදැයි හඳුනා ගැනීම ද
- කාව්‍ය විචාර සංකල්ප හඳුනා ගෙන රස විඳීමේ හා විචාරය කිරීමේ ශක්‍යතාව මැන බැලීම ද මේ පත්‍රයෙන් අපේක්ෂිත ය.



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources

01. පහත දැක්වෙන (අ), (ආ), (ඉ), (ඊ) සහ (උ) උද්ධෘත අතුරෙන් හතරක් තෝරා ගෙන අසා ඇති ප්‍රශ්නවලට ද (ඌ) සහ (එ) ප්‍රශ්නවලට ද පිළිතුරු සපයන්න. (මේ ප්‍රශ්නයට පිළිතුරු ලිවීමේ දී වර්තමාන ලේඛන ව්‍යවහාරය ම යොදා ගන්න.

(අ) (i) ආභරණය සකස් කිරීම සඳහා අවශ්‍ය රත්තරන්වලට හා ආභරණය සකස් කිරීම සඳහා වැඩ කුලිය සඳහා

(ii) තමා ම රත්තරන් මිලට ගෙන, අකුරු ලියන්නට නොදන්නා කෙනෙක් කොළවල ඉරි අඳින ආකාරයට රත්තරන්වල ඉරි ඇඳ තළා දමා කැටයම් ආදි සියුම් ලක්ෂණ/ වැඩ නොමැති ව/ (මෙකී අදහස් ඇතුළත් වන සේ ලියා ඇතොත් ලකුණු දෙන්න.)

(iii) ඒ කුමාරයාට වයස අවුරුදු දහසය කාලයෙහි/ වූ කල්හි

(iv) කැටයම් (1 × 4 = 4 යි)

(ආ) (i) කෝටි දහ අටක්/ දහ අට කෝටියක්

(ii) බිම්බිසාර රජතුමා සහ නගරවැසියෝ

(iii) තට්ටු හතකින් යුතු විශාල ප්‍රාසාදයකුත්/ මහා මාළිගායකුත්

(iv) බොහෝ/ අප්‍රමාණ සැප සම්පත් ඇති (1 × 4 = 4 යි)

(ඉ) (i) හිවලා/ හිවල් වෙස් ගත් ශක්‍රයා මත්ස්‍යා අල්ලා ගැනීමට සිතා කටින් රැගෙන ගිය මස් කැබැල්ල කටින් බිම දමා ගිය උකුස්සකු පැමිණ මස් කැබැල්ල පැහැර ගැනීමෙන් මස් කැබැල්ල අහිමි වීම හා මත්ස්‍යා ජලයට පැනීමෙන් මත්ස්‍යාත් අහිමි වීම./ හිවලාට මත්ස්‍යා හා මස් කැබැල්ල යන දෙක ම අහිමි වීම.

(ii) මෙසේ නො කළ යුතු දේ නො කොට පතිවත ආරක්ෂා කර ගන්නා ලෙස ය.

(iii) **දෙදෙනා ම අහිමි වී සිටින ඔබ මට අපහාස කොට සිනාසෙයි.**

(iv) චතුරාර්ය සත්‍ය/ උතුම් සත්‍ය හතර/ දුක්ඛ, දුක්ඛ සමුදය ආර්ය, දුක්ඛ නිරෝධ ආර්ය, දුක්ඛ නිරෝධ ගාමිණි පටිපදා ආර්ය යන සත්‍ය හතර. (හතර ලියා තිබුණොත් ලකුණු දෙන්න.) (1 × 4 = 4 යි)

(ඊ) (i) තමා පොරවා සිටි වස්ත්‍රය මඳක් ඉවත් කොට ශරීර ප්‍රභාව/ පැහැය ආලෝකය විහිදුවීම.

(ii) කාමයෙන් උම්මත්තක වී, ශෝකයෙන් දැවුණු සිරුරු ඇති වී, උණුසුම් ලෙස ඉහළ පහළ දමන හුස්මෙන් පිරුණු මුඛය හා නාසය ද කඳුළු ධාරාවෙන් තෙත් වුණු ඇස් ඇති වී සිහි නැති වීම/ සිහි මුළා වීම. (මේ ආකාරයට පිළිතුරු වෙනත් ආකාරයෙන් හෝ ගළපා ලියා ඇත්නම් අදාළ ලකුණු පිරිනමන්න.)

(iii) අර/ ඔය උතුම්/ උසස් ආසනය මත සිටින තැනැත්තා/ කෙනා

(iv) තද රතු පැහැති තොල් දෙක/ සඟල (1 × 4 = 4 යි)

(උ) (i) සියලු ශාස්ත්‍ර

(ii) සියලු සත්ත්වයන් දෙස

(iii) **ඔහුගේ තේජස නම් වූ සූර්යයා/ හිරු/ ඉරු වික්‍රමාන්විත භාවය නම් වූ කඳු මුදුනේ දිලිසෙන කල්හි/ දිලිසෙද්දී/ බබළන් කල්හි/ බබළද්දී ( ප්‍රශ්න පත්‍රයෙහි කවියෙහි මුද්‍රණය වී ඇති 'දිලහෙන' යන වචනය 'දිලිහෙන' ලෙසින් සංශෝධනය විය යුතු ය.)**

(iv) සඳ/ චන්ද්‍රියා (1 × 4 = 4 යි)



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers · Model Answers · Study Resources

(උ) අවස්ථා සම්බන්ධය ලිවීම:

දී ඇති පාඨ හතෙන් හතරකට පමණක් පිළිතුරු සැපයිය යුතු ය. එක පාඨයකට ලකුණු තුනක් හිමි වේ. ලකුණු දීමේ නිර්ණායක මෙසේ ය.

- යුගය (යම් යුගයකට අයත් නම්), කතුවරයා, අදාළ කෘතිය, කථා වස්තුව/ කතාව සඳහා - ලකුණු 01 යි.
- කා විසින් කාට පවසන ලද්දක් ද යන්න - ලකුණු 01 යි.
- අවස්ථාව කුමක් ද යන්න - ලකුණු 01 යි.

**පිළිතුරු**

(i) දඹදෙණි සාහිත්‍ය යුගයෙහි ධර්මසේන හිමියන් විසින් රචනා කරන ලද සද්ධර්මරත්නාවලියෙහි කුණ්ඩලකේසීගේ වස්තුවෙන් උපුටා ගත් පාඨයකි. වාද දහස විසඳීමෙන් පසු සැරියුත් හිමියන් විමසූ පැනයට පිළිතුරු දීගත නොහැකි වූ මෙකී පැනය බුදුන් වහසේගේ පැනයකැයි තෙරුන් වහන්සේගෙන් දැන ගත් ජම්බුපරිබ්‍රාජිකාව විසින් සැරියුත් තෙරුන් අමතා මෙසේ පවසන ලදි. (ලකුණු 03 යි)

(ii) කුරුණෑගල සාහිත්‍ය යුගයෙහි විරචිත ජාතක පොතෙහි එන 'චුල්ලධනුද්ධර' ජාතකයෙහි අතීත කථාවෙන් උපුටා ගත්තකි. තම ස්වාමියා සොරා ලවා ඝාතනය කරවූ ස්ත්‍රිය සොරා සමග ගමන් කරන අවස්ථාවේ දී, ගඟක් අසලට පැමිණෙයි. තම ස්වාමියාට කළ දෙය තමන්ට ද සිදු විය හැකි බව වටහා ගන්නා සොරදෙටුවා ඇය රවටා ඇගේ වස්ත්‍රාභරණ පැහැරගෙන යාමට සිතා ඇයට මෙසේ පවසයි. (ලකුණු 03 යි)

(iii) ගම්පොළ යුගයේ දී දෙවන ධර්මකීර්ති හිමියන් විසින් රචනා කරන ලද සද්ධර්මාලංකාරයෙහි එන නන්දිවාණිජ වස්තුවෙහි එන පාඨයකි. නන්දිය වෙළෙන්දාගේ බිරිඳ කෙරෙහි ආශක්ත වූ ශිව අමාත්‍යවරයා දාසියක අත අවස්ථා හතරක දී තම කැමැත්ත ඉටු කර ගැනීමට උත්සාහ දරයි. මෙසේ පඩුරු යැවූ හතරවැනි අවස්ථාවේ දී නන්දිය වෙළෙන්දාගේ බිරිඳ විසින් දාසියට මෙසේ පවසන ලදි. (ලකුණු 03 යි)

(iv) දඹදෙණි යුගයෙහි මයූරපාද පරිවේණාධිපති බුද්ධපුත්‍ර හිමියන් විසින් රචනා කරන ලද පූජාවලියෙහි අනුරුද්ධ කුමාර වස්තුවෙන් උපුටා ගන්නා ලද්දකි. තමාට පෙර උපාලි නම් කපුවා මහණ කරන මෙන් අනුරුද්ධ කුාරයා ඇතුළු ව කුමාරවරුන් හය දෙනා බුදුන් වහන්සේගෙන් ඉල්ලා සිටි අවස්ථාවේ දී බුදුන් වහනසේ විසින් කුමාරවරුන් හයදෙනා අමතා මෙසේ පවසන ලදි. (ලකුණු 03 යි)

(v) ලෙනාඩ් වුල්ෆ් විසින් රචනා කරන ලද, ඒ. පී. ගුණරත්නයන් විසින් සිංහලයට අනුවර්තනය කරන ලද බැද්දේගම නවකතාවෙහි එන්නකි. එක් දිනක් බබුන්ගේ නිවසට පැමිණි ප්‍රනාන්දු මුදලාලි කොළඹ ගැන විස්තර කරමින් සිටින අවස්ථාවේ දී පුංචි මැණිකා විසින් ප්‍රනාන්දු මුදලාලිගෙන් මෙසේ විමසන ලදි. (ලකුණු 03 යි)

(vi) මහාචාර්ය ඒ. වී. සුරවීරයන්ගේ 'අකුරට යන වෙලාවේ' කෙටි කතාවෙහි එන පාඨයකි. සුභද්‍රාවතී නම් දැරිය කරුණාපාල නිවසට කැඳවාගෙන ගිය අවස්ථාවේ දී ඇය රැගෙන ආ දරුවාගේ පියා 'දරුවා පැමිණියේ ඉංග්‍රීසි ඉගෙන ගැනීමට හැකි ය' යි පැවසූ නිසා බව පැවසූ අවස්ථාවේ දී විශ්ව විද්‍යාල කථකයා වන සිරි විසින් සුභද්‍රාවතීගේ පියාට මෙසේ පවසන ලදි. (ලකුණු 03 යි)

(vii) මහාචාර්ය සරච්චන්ද්‍ර මහතාගේ 'පේමතො ජායතී සෝකෝ' නාටකයෙහි එන පාඨයකි. ස්වර්ණතිලකා විවාහ කර ගත් උද්දාල බමුණා ස්වර්ණතිලකාගේ ඉල්ලීම අනුව රාජවාසල සේවයට යාමට සූදානම් වන අවස්ථාවේ දී තමාට ශිල්ප ශාස්ත්‍ර ලබා නොදුන්න ද තමගේ ජීවිතය අත්වැලක් වන මෙන් ස්වර්ණතිලකා ඉල්ලා සිටි අවස්ථාවේ දී උද්දාල බමුණා විසින් ස්වර්ණතිලකාට මොසේ පවසන ලදි.

(ලකුණු 03 යි)



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources
iexamhub

**(එ) රසාස්වාදය ආදර්ශ පිළිතුර**

- වර්ෂ 1941 වර්ෂයේ දී මුනිදාස කුමාරතුංගයන් විසින් දෙස, බස, රැස තෙරුවන සේ සලකා නිර්මාණය කෙරුණු දේශප්‍රේමී ව්‍යාපාරය 'හෙළ හවුල' නමින් හැඳින්වේ. හෙළ හවුලෙහි කවියන්ගේ කාව්‍ය භාෂාවෙහි ලක්ෂණ කීපයකින් සමකාලීන කවියන්ගෙන් වෙනස් විය.

එනම්,

(i) ශුද්ධ සිංහල ව්‍යවහාරය පමණක් භාවිත කිරීම.

(ii) 'ඇ' කාරය සිංහල භාෂාවෙහි අනන්‍යතා ප්‍රකට කරන අකුරක් සේ සලකා 'ඇ' කාරය භාවිතය.

(iii) දේශීයත්වය, අදීනත්වය ප්‍රකට නිර්මාණවලට මුල් තැනක් දීම.

(iv) ලිඛිත ව්‍යාකරණය ආරක්ෂා කිරීම ආදි ලක්ෂණ යි. මෙකී ලක්ෂණ මඟුල් ගීය පැදි පෙළෙහි දක්නට ලැබේ.

**වස්තු විෂය/තේමාව**

අරීසෙන් අහුබුදු මහතා විසින් රචනා කරන ලද 'මඟුල් ගීය' පැදි පෙළ හෙළ හවුලෙහි කාව්‍ය අනන්‍යතා ප්‍රකට කෙරෙන කදිම පැදි පෙළකි. පැදි පෙළට විෂය වන්නේ බක් මාසයෙහි ජීව-අජීව පරිසරයට වන වෙනස්වීම් ඉදිරිපත් කිරීම යි. එය වනාහි දෙයාකාර ය. ස්වාභාවික පරිසරය හා මිනිස් සබඳතා යනුවෙනි. වඩාත් වැදගත් ලක්ෂණය නම් බක් මාසයට ස්ත්‍රීත්වයක් ආරෝපණය කොට ඇය විසින් මෙකී සියලු වෙනස්කම් ඇගේ මැදිහත් වීමෙන් සිදු වන ආකාරයෙන් පැදි පෙළ ඉදිරිපත් වීම යි.

**භාෂා භාවිතය**

- හෙළ හවුලෙහි කවියට ආවේණික වූ අමිශ්‍ර සිංහල ව්‍යවහාරය යෙදීම.
  නිදසුන් - "**කුරුළු සරින්**", "**මල්සර**", "**සිසිර කුමරි**"
- ධ්වනිතාර්ථවත් භාෂාවක් යෙදීම.
  නිදසුන් - ජම්බු ගසෙහි ගෙඩි හට ගැනීම - "**ජම්බු ගහට රත පොරවන්නී**"
  බක් මී ගසෙහි කහපාට මල් පිපීම - "**බක් මී ගහ අන්දන්නී**"
  නාමල් පිපී සුවඳවත් වීම - "**නාගස් සුවඳින් බැඳලන්නී**'
- හෙළ හවුලට ආවේණික අමිශ්‍ර සිංහල වහරත්, 'ඇ' කාර භාවිතයත් කැපී පෙනෙන ලක්ෂණයකි. ලොවට මැ, 'රට වටැ', 'තුරු - ලන්නී ආදි 'ඇ' කාර භාවිතය කවියෙහි රසයට කිසිදු හානියක් කොට නැත.
- අප්‍රාණික වස්තූන් සප්‍රාණික වස්තූන් බවට පෙරළා වසන්ත කුමරියගේ මැදහත් වීමෙන් මේ සියලු වෙනස්කම් සිදු වන බව කවියා පවසයි. එබැවි '**ගන්වන්නී**' ආදි අයුරින් ස්ත්‍රී ලිංගවාචී කෘදන්ත නාමය යෙදීමෙන් පැහැදිලි වෙයි. ස්වාභාවික සංසිද්ධීන් අන්‍යාකාරයෙන් පවසන කාව්‍ය අලංකාරය වන 'උත්ප්‍රේක්ෂ' නම් අලංකාරය මෙහි දී භාවිත කොට ඇත.
  නිදසුන් - "මල් ගොමු ගුමු ගුමු ගන්වන්නී..."
  "ගමේ මැ පුහුලන් ඉදවන්නී..."
  "කොල්ලන් කෙල්ලන් බැඳලන්නී..."
- අනුප්‍රාසය හා එළිසමය භාවිත කිරීම.
  අනුප්‍රාසය - "දෙක-දෙක", "ගෙයි-ගෙයි", "රට-වටැ", "දස-දෙස"
  එළිසමය - "ගන්වන්නී", "පුරවන්නී", "පිනවන්නී", "කරවන්නී"
- **සංකල්ප රූප නිමවන භාෂා ප්‍රයෝග**
  දෘෂ්ටි ගෝචර හා ශ්‍රව්‍ය ගෝචර සංකල්ප රූපවලට වැඩි ඉඩක් පැදි පෙළෙහි ඇත.



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub

'මල් ගොමු ගුමු ගුමු ගන්වන්නී'

'කුරුලු සිතින් කන් පිනවන්නී' -ශ්‍රව්‍ය ගෝචර සංකල්ප රූප-

**(ඉහත දක්වා ඇති භාෂා භාවිතය යටතෙහි ඉහත දක්වා ඇති කරුණු ඇතුළත් කොට පිළිතුරු ලිවිය යුතු අතර එවිට ඉහළ ලකුණක් ලබා දිය හැකි ය.)**

**(මුළු ලකුණු 12 යි)**

(02) පහත (අ) කොටසේ ප්‍රශ්නය සහ (ආ) කොටසින් එක් ප්‍රශ්නයක් තෝරා ගෙන පිළිතුරු සපයන්න.

(අ) කුරුණෑගල-දඹදෙණිය යුග සිංහල ගද්‍ය සාහිත්‍යයේ නවෝදයක් සනිටුහන් කළ වකවානුවකි.'' මේ පිළිබඳ ඔබේ අදහස් දක්වන්න.

**ආදර්ශ පිළිතුරෙහි අන්තර්ගත විය යුතු කරුණු**

- දඹදෙණි රාජධානි සමයේ දී විදේශාක්‍රමණවලින් රට නිදහස් කොට ගැනීමෙන් අනතුරු ව ඇති කෙරුණු සාහිත්‍ය ප්‍රබෝධය හා ශාසන පුනර්ජීවනය හේතුවෙන් සාහිත්‍ය කටයුතු උද්දීප්තියට පත් විය. තෙවන විජයබා හා දෙවන පැරකුම්බා රජවරුන්ගේ හා දේවපතිරාජ වැනි ඇමතිවරුන්ගේ අනුග්‍රහය මෙකී සාහිත්‍ය ප්‍රබෝධයට හේතු විය. දඹදෙණි සාහිත්‍ය යුගය පොලොන්නරු සාහිත්‍යයෙහි ම දිගුවක් හැටියට හැඳිනගත හැකි අතර ගද්‍ය පද්‍ය කෘති රාශියක් ද මෙකල බිහි විය. මයූරපාද පරිවේණාධිපති බුද්ධ පුත්‍ර හිමියන් විසින් විරචිත බුදුන් වහන්සේගේ 'අරහං' බුදු ගුණය තේමාව කර ගත් **'පූජාවලිය'** තෙරුවන් ගුණ පවසන බෝධිසත්ත්ව පාරමිතාවෙහි අගය පහදන කෘතියකි. එය ධර්ම ව්‍යාඛ්‍යාන ග්‍රන්ථයක් වශයෙන් රචිත ව ධර්මෝපදේශ ඉස්මතු කොට දක්වා ඇත. ධර්මසේන හිමියන් විසින් පාලි ධම්මපදට්ඨ කථාව මූලාශ්‍රය කොට රචනා කරන ලද **'සද්ධර්මරත්නාවලිය'** බණ කථා සංග්‍රහයක් වුවත් හෘදයග්‍රාහී ගුණයෙන් යුක්ත ව රචනා කොට තිබීම කෙරෙහි විශේෂත්වයකි. අලංකාරවාදී සම්ප්‍රදායෙන් මිදී ධර්මෝපදේශ ඉදිරිපත් කරමින් ශ්‍රාවක මනසෙහි ශ්‍රද්ධාව ජනනය වන ආකාරයෙන් හා ගැමි ජීවිතවලට වඩාත් සමීප භාෂාවක් භාවිත කොට කතා වස්තු ඉදිරිපත් කොට ඇත. මීය අමතර ව 'යෝගාර්ණවය' හා 'ප්‍රයෝගරත්නාවලිය' යන වෙද පොත් දෙක රචනා වීම, සන්න කෘති රචනා වීම හා පිටපොත් රචනා වීම දඹදෙණි සාහිත්‍යයෙහි ඇති නවෝදයකි.
- ශාසනයට හා අධ්‍යාපනයට මෙහෙයක් ඉටු කෙරුණු දේශපාලන නායකත්වය හේතුවෙන් කුරුණෑගල සාහිත්‍ය සමය උද්දීපනය විය. මේ අවධියේ වැදගත් ම සාහිත්‍යික කර්තව්‍යය වන **'ජාතක පොත'** සිංහලයට පරිවර්තනය වීම ය. එකී කෘතිය පරිවර්තනය කිරීමට මූලිකත්වය ගත් අය පිළිබඳ වත් එමඟින් ශ්‍රාවක මනසෙහි ශාස්තෘන් වහන්සේ පිළිබඳ ශ්‍රද්ධාවත් කුලුගන්වා ඇත. **සඟසරණ, සිංහල ථූපවංසය** හා **සිංහල බෝධිවංසය** ද මේ යුගයේ රචනා වූ ගද්‍ය ආඛ්‍යාන වෙයි. ඒවායේ ශාස්තෘන් වහන්සේගේ චරිතය හා ස්මාරක විෂයයෙහි ශ්‍රද්ධාව ජනනය කිරීම හා ධර්මඥානය හා ශ්‍රද්ධාව පතළ කෙරෙයි. ඒ අනුව මේ කෘති ධර්ම දේශනා ශෛලියෙන් යුක්තව සම්පාදනය වීම, පාලි කථා වස්තු පදනම් කොට ගනිමින් ශ්‍රද්ධාව ජනනය වන ආකාරයෙන් කථා වස්තු රචනය වීම, වස්තු විෂයයෙහි විවිධත්වයක් ඇති වීම මේ අවධිවල ගද්‍ය සාහිත්‍යයෙහි ඇති වූ නවෝදයෙහි ප්‍රතිඵලයකි.

**(එක් යුගයකින් අඩු ම තරමින් එක් කෘතියක් ඇතුළත් වන සේ කෘති තුනක් ගැන සඳහන් කරමින් පිළිතුර ලියා තිබීම ඉහළ ලකුණක් ලබා දීමට ප්‍රමාණවත් ය. මෙකී සාහිත්‍ය යුගවල දී සාහිත්‍යයේ නවෝදයක් ඇති වූ ආකාරය සහේතුක ව පැහිදිලි කළ යුතු ය.)** **(ලකුණු 07 යි)**

(ආ) ''තීරණාත්මක මොහොතක බුද්ධිමත් ව ක්‍රියා කළ යුතු බව සද්ධර්මරත්නාවලී කතුවරයා අවධාරණ කරයි.''
නියමිත කතා ඇසුරෙන් සාකච්ඡා කරන්න.

- සද්ධර්මරත්නාවලියෙහි එන මට්ටකුණ්ඩලී වස්තුවෙහි අදින්න පුබ්බක බමුණා තීරණාත්මක මොහොතක බුද්ධිමත් කටයුතු නෙකිරීමෙන් තම ආදරණීය පුත්‍රයා අහිමි කර ගන්නා ආකාරයත්, කුණ්ඩලකේසී වස්තුවෙහි එන සිටුදුව



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources
iexamhub

හා සොරා හැඟීම්වලට වහල් වී ගන්නා තීරණ නිසා විය හැකි විනාශයන් ගැනත් සාකච්ඡා කෙරෙයි. එවැනි සිදුවීම් හරහා කතුවරයා උත්සාහ කරන්නේ තීරණාත්මක අවස්ථාවල දී බුද්ධිමත් ව ක්‍රියා කළ යුතු බව ය.

- අදින්න පුබ්බක බමුණා පුතාට කුණ්ඩලාභරණය සාදන අවස්ථාවේ දී ගත් තීරණය බුද්ධිමත් එකක් නොවේ. එයින් සිදු වන්නේ නොගැළපෙන කර්ණාභරණයක් පැලඳූ පුතාට එවැනි ම නමක් පටබැඳීමකි.

  **''...දන්නා නොදන්නා තමා ම කරන කලට වියදම් වන දෙයක් නැත්තේ වේ දැ' යි බොහෝ සිතිවිලි සිතා තුමූ ම රත්රන් හැරගෙන අකුරු ලියන සේ නොදන්නා කෙනෙකුන් පත්වල හිරි අඳනා සේ කුණ්ඩලාභරණ සේ තළාපියා දුන්හ. ඒ කුණ්ඩලාභරණය උරුට්ටු ආදි වූ සූක්ෂ්ම කර්මාන්ත නැති හෙයින් මටසිලුටු විය. එසේ හෙයින් කුමාරයන්ට නම් තබන්නෝ මට්ටකුණ්ඩලී නම් තුබූහ.''**

- දරුවා අසනීප වූ අවස්ථාවේ බුද්ධිමත් තීරණයකට නොඑළඹුණු නිසා තම දරුවා බේරා ගැනීමට බමුණාට නොහැකි වෙයි.

  **''බමුණාණෝ ඒ අසා 'පින්වත් බැමිණි කුමක් කියයි ද? පිළියමට වෙදවරුන්ගෙනා කල වෙදකම් නිමන තෙක් බතුත් දුනමැනව. මංකුලීත් දුන මැනව. කෙළවර මිලත් දුනමැනව. බලවත් ව තිබෙන ව්‍යාධි හෙයින් මිලත් මදෙකින් සෑහී නොයෙයි.''**

- තීරණාත්මක අවස්ථාවේ දී බුද්ධිමත් ව තීරණයක් ගත නොහැකි වූ බමුණා ඉන් පසු සොහොන් බිමට ගොස් පශ්චාත්තාප වෙයි.

  **''බමුණාණෝ ද මළ පුතණුවන් දවාපියා උරගජාතකයෙහි මහබෝසතුන් මෙන් තමන් ශෝක නැති වන කාරණ නොදන්නා බැවින් දවස්පතා ම සොහොන් ගොසින් 'අනේ, එක පුතණුවෙනි' යනාදිය කියකියා හඬති.''**

- සිටු දුව නොගැළපෙන කෙනෙකු සමඟ විවාහ වීම හැඟීම්වලට වහල් ව ගන්නා තීරණයකි.

  **"අපට අනික් කවුරුනුත් නොකැමැත්තේ මුන් නොලදොත් මියෙමි...''**

- පිදේනිය පුදන්නට යෑම හැඟීම්වලට වහල් වී ගත් තීරණයකි.

  **"උයිත් තරම සිත් ගන්නට ම සිතන හෙයින් එලෙස ම කළහ."**

- සොර සිටු දුවු මරා ආභරණ පැහැර ගෙන ජීවත් වීමට සිතීම හැඟීම්වලට වහල්වීමකි.

  **"මෑ මරා පියා මැගේ ආභරණ හැර ගෙන රා බී ඇවිදිනවුන්ට විකොට පියා.."**

- නුසුදුසු විවාහයකට එළඹෙන්නේ හැඟීම්වලට වහල් වූ නිසා ය. එනිසා ම ඇය සොරාගේ උපක්‍රමවලට හසු වී ජීවිතයට මරණය ළඟා කර ගනී. ඇය උපක්‍රම යොදා මරණයෙන් ගැළවුණ ද එය ඇගේ ජීවිතය බරපතළ ගැටලුවකට ඇද දමයි.

  **"ගෙනායේ හැයිදැ'යි විචාළ කල්හි, තොපි මාරා පියා ආභරණ හැරගෙන පලායන්නට යි කී...''**

  **"උෟ තුමු බා ගොසින්..."**

- මෙකී ස්ත්‍රීන් මරා ආභරණ පැහැරගෙන රා බී ඇවිදීමට සුදානම් ව තම හැඟීම්වලට ඉඩ දුන් සොරා සිටු දුව අතින් මැරුම් කයි. හැඟීම්වලට වහල් වීමෙන් ඔහුට මරණය අත්පත් වෙයි.

  **"හෙතෙම කඩ කඩ ව ගලින් හී මිය තෙමේම බිලි විය.."**

- විවාහය ජීවිතය ගැන ගන්නා තීරණ අතිශයින් ම බුද්ධිමත් ව නිවැරදි ව ගත යුතු බව කුණ්ඩලකේසීගේ වස්තුවෙන් අවධාරණය කෙරෙයි.

**(ඉහත දක්වා ඇති උදාහරණ අවස්ථා තුනකින් පිළිතුර ලියා තිබීම ඉහළ ලකුණක් ලබා දීමට ප්‍රමාණවත් ය.)**

නැත හොත්,

''අවස්ථානුකූල ව බුද්ධිමත් තීරණ ගැනීමේ අවශ්‍යතාව ජාතක කථාවලින් මැනවින් පෙන්වා දෙයි.'' නිර්දිෂ්ට කථා ආශ්‍රයෙන් විමර්ශනය කරන්න.



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

- මිනිස් සිත අතිශයින් සංකීර්ණය, පුදුමාකාර ය. එකී මනසෙහි පහළ වන සිතුවිලි එකිනෙකට පටහැනි ය. 'සිග්මන් ෆ්‍රොයිඩ්' නම් මනෝ විද්‍යාඥයා සිතෙහි සංකීර්ණත්වය තෙයාකාරයැ'යි පවසා ඇත. ජාතක කතාකරුවා ද මිනිස් සිතෙහි පහළ වන විවිධාකාර සංකීර්ණ සිතුවිලි විවරණය කිරීමට පෙලඹේ. එවැනි සංකීර්ණ සිතුවිලි ඇති මිනිසා අවස්ථානුකූල ව බුද්ධිමත් තීරණ ගත යුතු ය. ජාතක කථාකරුවා අවස්ථානුකූ ව බුද්ධිමත් තීරණ ගැනීමේ අවශ්‍යතාව චන්ද කින්නර ජාතකයෙන් හා චුල්ල ධනුද්ධර ජාතකයෙන් අවධාරණය කොට ඇත. එවැනි නිදර්ශන අවස්ථා කීපයක් පහත දැක්වේ.

✓ කිඳුරියට තම බිරිඳ වන මෙන් ආරාධනා කළ අවස්ථාවේ ඇය අවස්ථානුකූල ව බුද්ධිමත් ව කටයුතු කිරීම නිසා රජතුමා ඇය සමඟ අමනාප ව ඇය අතැර යාම.

**"අවලක්ෂණ, තෝ මා නිසා නිරපරාධ වූ මාගේ සමණා මැරී ද? ඔහු කෙරෙ ස්නේහයෙන් අඬා මියන මුත් තොපට පාදපරිචාරිකා වීමෙක් ඒකාන්තයෙන් නොවෙයි."**

✓ තමාගේ මරණයට වඩා කිඳුරියගේ සතුට ගැන සිතූ සඳ කිඳුරා වේදනාව ඉවසා දරා ගැනීම.

**"වැළිත් මේ සෝක දුක්ඛය උදක් මාගේ ම ජීවිත අපේක්ෂාවේ ම නොවෙයි. මා මළ කල්හි මාගේ වියෝග ශෝකයෙන් හඬා පෙර මා හා සමඟ එක්ව කෙළ ඇවිද...''**

✓ රජුගේ අරමුණු ඉටු නොවුණු විට කිඳුරියට බැණ වැදීම.

**"හිරුක් ජාතී වූ පැවැත්තිය, ඉදින් ජීවත් වනු කැමැත්තේ වී නම් තලිස් පතුරු හා තුවරලා ගෙදුරු කොට වසන්නාවුන් කී සේ සමාන ජාති ඇති තිරිසනුන් හා රමණය කෙරෙමින් වැස, වැලි තිට රට කුලෙහි සම්පත්තීන් ප්‍රයෝජන කිම් දැ' යි කියා කිඳුරාංගනාවට සටා බැණ ඈ කෙරෙහි ආලය පසිඳ නැගී ගියාහ."**

✓ කුමරා මැරීමට සොරාට කඩුව දෙන අවස්ථාව ද අවස්ථානුකූල ව බුද්ධිය මෙහෙයවීම නොවීම නිසා සිදු වන මහා විනාශයන් පිළිබඳ ඉඟි කරයි. එයින් එවැනි සංකීර්ණ අවස්ථාවල දී අවස්ථානුකූල ව බුද්ධිය මෙහෙයවීමට අවශ්‍ය පෙලඹවීම සිදු කරයි.

**"උනුන් කා සොරා යට කොට ඔබා ගෙන චුල්ලධනුද්ධරයෝ සොඳුර කඩුව දී ලව' යි අත දික් කොට ලන්නා සොරාට කඩු මිට දී චුල්ල ධනුද්ධරයන්ට කොපුව දිලුහ. සොරා චුල්ලධනුද්ධරයන් ඉස කපා මරා යන්ට..."**

✓ හැඟීම්වලට වහල් වී බුද්ධියෙන් කටයුතු නොකිරීම නිසා කාන්තාවට පෙර ස්වාමියාත්, සොරා හා තම වස්ත්‍රාභරණත් අහිමි වෙයි.

**"ඇයි ස්වාමි පුත්‍රයාණෙනි, මා හැර පියා නික්මුණු නියාදැ'යි කියන්නී" තොපගේ පරණ සමණන්ට කළ දෑ දුටු කළ මට තමා ම වේ ද ? තිගෙන් මට ප්‍රයෝජන නැතැ'යි කියා නික්මුණහ."**

**(ඉහත දක්වා ඇති උදාහරණ අවස්ථා තුනක් සහිත ව පිළිතුර ලියා තිබීම ඉහළ ලකුණක් ලබා දීමට ප්‍රමාණවත් ය.)**

**(ලකුණු 08යි)**

(03) ''ආශාවන් හා හැඟීම්වලට වහල්වීම නිසා මිනිසුන් මුහුණ දෙන ඛේදනීය අද්දැකීම් ඉතා රසවත් ව ඉදිරිපත් කිරීමට සද්ධර්මාලංකාර කතුවරයා සමත් ව ඇත.'' මේ කියමන උදාහරණ සහිත ව විමසන්න.

❖ ගම්පොළ යුගයේ විසූ දෙවන ධර්මකීර්ති හිමියන් විසින් පාලි 'රසවාහිනී' කෘතිය මූලාශ්‍රය කොට 'සද්ධර්මාලංකාරය' රචනා කරනු ලැබී ය. කතුහිමියන්ගේ මූලික පරමාර්ථය වනුයේ යහපත් ජන සමාජයක් ගොඩ නැගීම ය. ආශාවන් හා හැඟීම්වලට වහල්වීම නිසා මිනිසුන් මුහුණ දෙන ඛේදනීය අද්දැකීම් ඉතා රසවත් ව ඉදිරිපත් කිරීමට සද්ධර්මාලංකාර කතුවරයා සමත් ව ඇත. සද්ධර්මාලංකාරයෙහි එන ස්වර්ණතිලකා කතා වස්තුවෙන් සහ නන්දිවාණිජ කතා වස්තුවෙන් උක්ත කරුණ මනාව නිරූපණය කිරීමට ධර්මකීර්ති හිමියන් සමත් වී ඇති අයුරු උද්ධෘත විමසා බලමු.



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources
iexamhub

ස්වර්ණතිලකා කතාවස්තුවෙහි එන ස්වර්ණතිලකා වනාහි රූප සම්පත්තියෙන් අගතැම්පත් හීන කුලයක උපන් ස්ත්‍රියකි. පෙර ආත්මයන්හි කළ කුසලාකුසල කර්මයන්ගේ විපාක අනුව ඇය හීන කුලයක උපත ලැබූ ඇය ආශාවන් හා හැඟීම්වලට වහල් වෙයි. ස්වර්ණතිලකා සැඩොල් කුලයක තරුණියක නිසා ඇය විවාහ කර ගැනීමේ අදහසින් සැඩොල් කුල පුත්‍රයන් විසින් ගෙනෙන ලද විවාහ යෝජනා ප්‍රතික්ෂේප කිරීමට තරම් අහංකාර වනුයේ සිය තත්ත්වයට වඩා ආශාවන් ඉහ-වහා ගොස් ඇති හෙයිනි. ඒ හේතුවෙන් අවසානයේ ස්වර්ණතිලකාට සිදුවන්නේ පියා සමඟ නුවරින් පිටමං වීමට ය.

**''ගැහැණුන් දුටු කළ කාලකණ්ණියක දකිපීම්' යි කිරිවතුරෙන් මුහුණ ශුද්ධ කෙරෙයි. එබැවින් තාගේ, සමර්ථ වූ නම් ඒ බමුණා හා සහවාසය කෙරේවයි මෙසේ මා කී ලෙසට කාගේ දුවට කියා බලගැ'යි කීහ.''**

තම රූ සපුවෙන් උදම් වී වංශවතෙකු ප්‍රාර්ථනා කිරීමේ අරමුණ ඉටු කර ගනු වස් උත්තර මධුරා පුරයෙන් පිටත් ව යන්නේ උද්දාල බමුණා සමඟ සහවාසය කිරීමේ අරමුණෙනි. අභියෝගය ජයගත් ස්වර්ණතිලකා උද්දාල බමුණාගේ ප්‍රතිපත්තීන් බිඳ දමා ඔහු සමඟ සහවාසය කිරීමට සමත් වුව ද එහි අවසන් ප්‍රතිඵලය වූයේ ස්වර්ණතිලකාට අකල් මරණයකට ගොදුරු වීමට සිදුවීම ය. එපමණක් නොව ස්වර්ණතිලකාගේ වියෝවෙන් උද්දාල බමුණා ද සිය දිවි පූජා කරනුයේ ආශාවන් හා හැඟීම්වලට වහල්වීම නිසා පරිහානියට පත් වන ආකාරය සනාථ කරමිනි.

**''මෙබඳු ස්ත්‍රීරත්නයකින් වියෝව ජීවත් වීමට වඩා මිය යාම යහපතැ' යි මහත් වූ ශෝකයෙන් නොයෙක් ප්‍රලාප කිය කියා හඬමින් රාජාඞගණයෙහි දර සෑයක් බඳවා ගිනි වැද මළේය.''**

නන්දිවාණිජ කතා වස්තුවේ ශිව අමාත්‍යවරයා නන්දිය වෙළෙඳාගේ බිරිඳ තමා සතු කර ගැනීමට අමනුෂ්‍ය බලවේගයක් නන්දිය වෙළෙඳා මැරීමට යැවුව ද අවසානයේ සිදු වූයේ ශිව ඇමතිවරයාත් යකැදුරාත් යක්ෂයාට ම බිලිවීම ය.

**''සතර වන වාරයෙහි ආවේශ කරවා නික්ම වූ කල්හි ගොසින් වෙළෙඳාණන් කරා වැද්ද නොහී ආපස්සේ ඇවිත් අමාත්‍යයා හා යකැදුරා දෙපළ කොට පොලු ගසා ආවේශ ව ගිය මිනියත් එතැනම එළා ගිය...''**

ආශාවන් හා හැඟීම්වලට වහල් වීම නිසා සත්ත්වයන් මහා ඛේදයන්ට ගොදුරු වන ආකාරය කතුවරයා රසවත් ව ඉදිරිපත් කරයි. අන් ස්ත්‍රීන් ප්‍රාර්ථනා කිරීම, ආශා කිරීම හා දුශ්චරිතයන්ගේ හැසිරීම, රාගිකත්වය කාමුකත්වයට වහල් වීම ආදි ආශාවන් හා හැඟීම් පාලනය කර ගත නොහැකි වුවොත්, අවසානයේ තමාට ම විනාශය ළඟා කරන බැව් උක්ත නිදසුන්වලින් ප්‍රදර්ශනය කෙරෙයි.

**(කතා දෙකෙන් ම ඇතුළත් වන පරිදි ඉහත දක්වා ඇති උදාහරණ අවස්ථා හතරක්වත් ඇසුරෙන් පිළිතුර ලියා තිබීම ඉහළ ලකුණක් ලබා දීමට ප්‍රමාණවත් ය.)**

**(ලකුණු 15යි)**

නැතහොත්,

''උත්සාහවන්ත ව හා කැපවීමෙන් කටයුතු කිරීමෙන් තම අපේක්ෂාවන් ජයගත හැකි බව පූජාවලී කතුවරයා මැනවින් පෙන්වා දී ඇත.'' නියමිත කතා ඇසුරෙන් උදාහරණ සහිත ව විස්තර කරන්න.

- ❖ පූජාවලියෙහි නිර්දිෂ්ට කතා වස්තු දෙක වන අනුරුද්ධ කුමාර වස්තුව සහ ජීවක කතා වස්තුව ඇසුරෙන් පිළිතුරු ලිවිය යුතු ය. අනුරුද්ධ කුමාර වස්තුවෙහි අනුරුද්ධ කුමාරයාගේ චරිතය හා ජීවක කතා වස්තුවෙහි 'ජීවක කතා වස්තුවෙහි ජීවකගේ චරිතයත් ඇසුරෙන් උත්සාහවන්ත ව හා කැපවීමෙන් කටයුතු කිරීමෙන් තම අපේක්ෂාවන් ජයගත හැකි බව පෙන්වා දීමට උත්සාහ කොට ඇත.
- ❖ අනුරුද්ධ කුමාර වස්තුවෙහි ඇත්තේ ධනවත් කුමාරයකු උත්සාහයෙන් සහ කැපකිරීමෙන් තම ආධ්‍යාත්මික ජීවිතය සාක්ෂාත් කර ගන්නා ආකාරය යි.



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

✓ මහණ වීම සඳහා දැඩි උත්සාහයෙන් හා කැපවීමෙන් කටයුතු කිරීම.

''තමන්ගේ ලක්ෂගණන් නළුපිරිස් හා තුන්සෘතුවට කළ තුන්පාය හා සියලු රජසැපත අලුයම දැමූ කෙළපිඬක් සේ සිතා සැපත්ලෝභය හැර...''

✓ මහණ වීමට යාමට මවගෙන් අවසර ගැනීමේ උත්සාහය අත් නොහැරීම.

''එවේලෙහි අනුරුද්ධකුමාරයෝ "මෑණියන් වහන්ස, කුමක් කියන සේක් ද? ගංගාවෙහි නිකුත් මහදියවතුර මහමුහුදට මුත් අතරෙක නොරඳන්නා සේ මාගේ ශ්‍රද්ධා නමැති මහවතුර සුගත් මහමුහුද වැද මුත් නොරඳා මය. සමු දුන මැනවැ'යි කීහ.''

"මෑණියන්වහන්ස ආකාශයෙහි නැගී වැසි මහපොළොව මුත් අනික් තෙනෙක නොරඳන්නා සේ මාගේ ශ්‍රද්ධා නමැති වර්ෂාව සුගත්භූමියෙහි පතිතව මුත් නොරඳා මය. සමු දුන මැනවැ'යි කීහ.''

''තව ද අනුරුද්ධකුමාරයෝ "මෑණින් වහන්ස, ආකාශයෙන්, පර්වතාග්‍රයෙකින් නිකුත් දියහැල්ලක් පර්වතප්‍රාන්තයෙහි රඳන්නා සේ මාගේ ශ්‍රද්ධා නමැති දියහැල්ල සර්වඥනමැති තියග්ගලයෙහි ගැලී මුත් නොරඳා මය; අවසර දුන මැනවැ'යි කීහ.''

✓ මහණ වීමට සිතන අවස්ථාවේ සියලු සම්පත් අත්හැර දැමීම.

''තමන්ගේ ලක්ෂගණන් නළුපිරිස් හා තුන්සෘතුවට කළ තුන්පාය හා සියලු රජසැපත අලුයම දැමූ කෙළපිඬක් සේ සිතා සැපත්ලෝභය හැර...''

✓ භද්දිය රජුට අනුරුද්ධ කුමාරයා කරන ප්‍රකාශය

''...මාගේ තුන්සෘතුවට කළ තුන්පාය ඇතුළු සුවහස්නළුපිරිස් ආදි වූ සියලු සම්පත් අලුයම දැමු කෙළපිඬක් සේ නොසිතා නුඹ හා එක්ව ගොස් මහණ වෙමි ම ය''

✓ උපාලි කපුවාට ආභරණ දීම.

''ඔවුනොවුන් ගිවිස්වා ගෙන තමන් තමන් පලන් සත්රුවන්ආභරණ ගලවා උතුරුසළුවෙක පොදි බැඳ උපාලි නම් කපුවාණන්ට දී...''

✓ අවසානයෙහි බුදු සසුනෙහි මහණ වී උසස් තත්ත්වයට පත් වීම.

''ඉක්බිත්තෙන් අනුරුද්ධ තෙරුන්වහන්සේ ද විදර්ශනා වඩා රහත් ව ත්‍රිවිද්‍යාවෙහි කෙළ පැමිණ පෙර තමන් වහන්සේ පියුමතුරා නම් බුදුන් සමයෙහි පාන් පූජා කළා වූ කුශලයාගේ බලයෙන් වැද හුන් එම අස්නේ හිඳ ලක්ෂයක් සක්වළ තුබූ තලඇටක් සා වස්තුවකුත් අත්ලෙහි තුබුවා සේ දක්නා තරම් දිවස් ලදින්...''

❖ ජීවක කතා වස්තුවෙහි කිසිදු කුලසම්පතක් නැති කුමාරයකු උත්සාහයෙන් සහ කැපකිරීමෙන් කටයුතු කොට වෛද්‍යවරයකු වී එකී වෘත්තිය හරයා ධනය හා කීර්තිය අත්පත් කර ගන්නා ආකාරය ප්‍රකාශ වෙයි.

✓ කෙසේ හෝ වෛද්‍යවරයකු වීමට කල්පනා කොට උත්සාහයෙන් වෛද්‍යවරයකු වීම.

''එතැන් පටන් ජීවකයෝ තමන් වූ පවත් දුන "මාගේ කිසි නෑසියකෙනෙකුත් නැත. මතු මට හිමි වන කුල සැපතෙකුදු නැත. එසේ හෙයින් මා විසින් ශිල්පයක් හදාරා ගත මැනව." කෙසේ වූ ශිල්පයක් හදාරම් දෝ හෝ'යි නිරවද්‍ය වූ ශිල්ප පරීක්ෂා කරන්නාහු "අෂ්ටාදශශිල්ප සූසැටකලාශිල්පයෙන් සෙසු ශිල්ප පරපීඩාපරහිංසා මිශ්‍රය. වෛද්‍යශිල්පය හදාරා ගතිම් නම් වෛද්‍යාචාරිය යන නම් ඇසූ කල ම සත්ත්වයෝ මවුන් පියන් ගුරුන් කොට ම සිතා ඔවුන් කෙරෙහි ප්‍රිය ඇති වන්නාහුය. වෛද්‍යශාස්ත්‍රය නම් දතුවාහට මෙලොවත් වැඩ වෙයි. පරලොවත් වැඩ වෙයි. පින් වෙයි. එසේ හෙයින් වෛද්‍යශාස්ත්‍රය ම උගන්මි...''

"කුමන ශාස්ත්‍රයක් උගනුදැ'යි විචාළහ."වෛද්‍යශාස්ත්‍රය උගනිමි'යි කීහ. ආචාරීහු 'ආචාරිභාගය ගෙනාවු දැ' යි විචාළහ. "දෙමවුපියන්ට නොකියා ශිල්පලෝභයෙන් සොරා අයිමි. එසේ හෙයින් ආචාරිභාගය නොගෙනායෙමි. නුඹවහන්සේට මෙහෙ කොට ධර්මාන්තේවාසික ව ශිල්ප හදාරමි'යි කීහ.''

✓ උත්සාහයෙන් සහ කැප කිරීමෙන් ඉක්මනින් ම ශිල්පය අවසන් කිරීම.



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

''අනුන් සොළොස් අවුරුද්දකින් උගන්වන්නා වූ ශිල්පය ශක්‍රයෝ තමන්ගේ ආනුභාවයෙන් ජීවකයන් සත් අවුරුද්දෙකින් ඉගැන්වූහ.''

"එකල ජීවකයෝ යහපතැයි ගිවිස සතරදවසක් දිවාභාගය මුළුල්ලෙහි සොළොස්ගවු තැන ඇවිද ඖෂධයකට නොතරම් වූ කිසියම් ද්‍රව්‍යයක් නොදැක ආචාරීන් කරා අවුත් "ස්වාමීනි, මේ මිනිස්ලොව නම් පූර්වයෙහි ඖෂධයෙන් ම මවන ලද වන. ඖෂධඝටිකාවක් වැන්න. ඖෂධයකට නොගත හැකි වස්තුවක් නො ලදිමි'යි කීහ. එවේලෙහි ආචාරි සමාධිව "පුත තොපට වෛද්‍යය අද පටන් නිමියේය. මේ මුළු පොළොව තොප තරම් වෛද්‍යාචාරී කෙනෙක් නැත. මම තොපට ආචාරිකමට අයෝග්‍යයෙමි. තෙපි මට ආචාරි වව'යි කියා ජීවකයන් සිඹ සනහා ගමට යවයි සමු දුන්හ.''

- උත්සාහය හා කැප කිරීමෙන් වෙදකම් කිරීම නිසා ධනය, වස්තුව හා කීර්තිය හිමි වීම.

''ඉක්බිත්තෙන් ජීවකයන්ට පියාණන්ගෙන් සාරදහසක් හා පියුදේවීන්ගෙන් සාරදහසක් හා පුතණුන්ගෙන් සාරදහසක් හා යෙහෙළණියන්ගෙන් සාරදහසක් හා මෙසේ සොළොස්දහසක් නීලකර්ෂාපණ සංඛ්‍යාත වූ රන් දී අසුන් යෙදූ රථයක් හා දාසදාසීන් ගවමහිෂයන් ආදි වූ බොහෝ සම්පත් දුන්හ.''

''ජීවකයන්ට හවුරුදු පතා ලක්ෂ නිමන නියම්ගමක් හා පවුරු පදනමින් සුරක්ෂිත වූ අඹ උයනක් හා සියගණනින් පරිවාරජනයන් හා සත්බුමුමහපායක් ආදි වූ බොහෝ සම්පත් දී...''

''මෙසේ ඒ ජීවකයන් දඹදිව දිව්‍යද්‍රැමයක් සේ ප්‍රසිද්ධ වූ සමයෙහි ම...''

**(ඉහත දක්වා ඇති උදාහරණ අවස්ථා හතරක් වත් ඇසුරෙන් පිළිතුර ලියා තිබීම ඉහළ ලකුණක් ලබා දීමට ප්‍රමාණවත් ය.)**

**(ලකුණු 15යි)**

(04)''විවිධ අවස්ථාවල පවතින විචිත්‍රත්වය දැක්වීමේ දී යෝග්‍ය පරිදි වෘත්ත වෙනස් කිරීම නිසා ගුත්තිල කාව්‍යය විශිෂ්ට පද්‍ය නිර්මාණයක් බවට පත් වී ඇත. නිර්දිෂ්ට පද්‍ය ආශ්‍රයෙන් පැහැදිලි කරන්න.

- ලඝු-ගුරු මාත්‍රා නියමය ඡන්දසෙහි ලක්ෂණය යි. එකී සඳැස් නියමිත ව පිහිටීමෙන් වෘත්ත බිහි වේ. චිරන්තන පද්‍ය නිර්මාණය වූයේ වෘත්ත පදනම් කොට ගෙන ය. ගී, සිවුපද, සිලෝ, සැහැලි ආදි ලෙසින් වෘත්ත විවිධ ය. ගී කාව්‍යයන් නිර්මාණය වූයේ ගී වෘත්තවලිනි. පසුව සිවුපද වෘත්ත ජනප්‍රියත්වයට පත් විය. ප්‍රතිභා පූර්ණ කවියෝ වෘත්ත හුදු සැරසිල්ලක් ලෙස ම යොදා නො ගත්හ. ගුත්තිල කවියා එවැන්නෙකි. කවියා විවිධ වෘත්ත යොදා ගත්තේ විවිධ අවස්ථාවල පවතින විචිත්‍රත්වය දැක්වීම සඳහා ය. ගුත්තිල කවියා ගී, වසත්, පෙද, උවදැ, සක්වා මෙන් ම සවිසිමත් වෘත්ත ද තම කාව්‍ය සංකල්පනා සඳහා යොදා ගත්තේ ය. උදාහරණ කීපයක් ඇසුරෙන් වෘත්ත භාවිතයෙහි ගුත්තිල කවියාගේ ප්‍රතිභාව විමර්ශනය කර බලමු.
- උදේනිපුර සැණකෙළියෙහි සිරි අසිරි ජීව ගුණයෙන් සපිරි සංකල්ප රූපාවලියක් බවට පෙරළා පාඨකයා ඉදිරියෙහි තැබීමට ගුත්තිල කවියා සමත් වෙයි. එහි දී කවියාට අභිමත ව ඇත්තේ වසන්ත වෘත්ත යි. එකී වෘත්ත වනාහි සැහැල්ලු කෙළිලොල් ස්වරූපය ජනිත කිරීමට සමත් වෘත්තකි. එක් පාදයක මාත්‍රා 12ක් පිහිටීම මෙකී වෘත්තෙහි ස්වභාවය යි. යතිය යෙදෙන්නේ මාත්‍රා හයෙන් හයට ය. පහත කවිය විමසා බලමු.

| | | | | | |
|---|---|---|---|---|---|
| උදා : | සරා | සලෙළු දන | සතොසේ | - | මාත්‍රා 12 |
| | සුරා | පාන කරන | ලෙසේ | - | මාත්‍රා 12 |
| | පුරා | අවුළු නොයෙක | රසේ | - | මාත්‍රා 12 |
| | සරා | අවන් හල් | සහසේ | - | මාත්‍රා 12 |

දර්ශන ශෘංගාරය ඇති කිරීමට වෘත්ත සමත් වේ. ප්‍රබල වාක්චිත්‍රයක් නිර්මාණය වේ. සරා, සුරා, පුරා, සරා, ආදී තැන්වල යෙදී ඇති ගුරු මාත්‍රාව සලෙලුන්ගේ චලනයන් වාක්චිත්‍රයක් බවට පෙරළයි. මාත්‍රා හයෙන් හයට තබා ඇති යතිය ද චලන චිත්‍ර සමූහයක් කවියට නංවයි. වෙස්මුහුණු බැඳ, ගී කියමින් නටමින් සතුටු වන



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources
iexamhub

නගරවාසීන්ගේ ජීවමය සිතුවමක් නිර්මාණය කිරීමට වසත් විරිත දායක වී ඇති අන්දම පහත කවියෙන් පෙන්වා දිය හැකි ය.

උදා : **කියමින් ගී රස මියුරු - මාත්‍රා 12**

**තබමින් පද තල අනුරු - මාත්‍රා 12**

**බැඳිමින් දන මන නුවරු - මාත්‍රා 12**

**කෙළෙමින් යෙති බැඳ බහුරු - මාත්‍රා 12**

ඉහත කවිය ද වසන්ත විරිතෙන් ම පබැඳී ඇත. විරිත ඇතුළත පද හසුරුවා ඇති ආකාරය සංකල්ප රූපයට ඉඩ සලස්වයි. කියමින්, තබමින්, බඳිමින් කෙළෙමින් ආදි තැන්වල යෙදී ඇති 'මින්' යන හලන්ත යෝගයත්, දන මන වැනි තැනක ඇති අනුප්‍රාසයත්, මියුරු, අනුරු, නුවරු, බහුරු යනුවෙන් යොදා ඇති එළිසමයත් නටන, ගයන, වයන නුවරුන්ගේ අත්පා සෙලවීමත්, හාවභාව ලීලාත්, දෘශ්‍ය රූපයක් බවට පෙරළීමට සමත් ය. රැගත් සුරා පිරූ විතින්, කෙළිමින් තැන තැන ලන්දූ, පැහැරැ රඟන සුරන් රඟා, පුරවා තුරු රැවින් අහස ආදි පද්‍යයන් ද වසත් විරිතෙන් ලියැවුණු විසිතුරු පද්‍යයන් සේ සැලැකිය හැකි ය.

- පෙද හෙවත් පදක විරිත ද වර්ණනයට උචිත භාවයන් උද්දීපනය කිරීම සඳහා විශිෂ්ට අයුරින් ගළපා ගැනීමට ගුත්තිල කවියා සමත් වෙයි. පෙද විරිතෙහි එක පදයක මාත්‍රා දහසයක් තිබිය යුතු ය. මාත්‍රා හතරෙන් හතරට යතිස්ථානය යෙදේ. පහත උදාහරණය විමසා බලමු.

උදා : **දිය දිය ගොස පළ කෙරෙමින් සපැමිණි - මාත්‍ර 16**

**ගිය ගිය තැන ඉස්වා රන් මුතු මිණි - මාත්‍රා 16**

**සිය සිය ගුණයෙන් වෙණනදනික්මිණි - මාත්‍රා 16**

**ගිය ගිය දිය නද එන මෙන් ගෙනමිණි - මාත්‍රා 16**

ගුත්තිල පඬිවරයාගේ වීණා නාදය මූසිල වීණා නාදය පරදවා ලෝකයෙහි පැතිර යන ආකාරය කවියෙන් ප්‍රකාශිත ය. එය ප්‍රකාශ කිරීමට උචිත ම විරිත පෙද විරිත යි. පෙද විරිත එකී අවස්ථාව රසවත් ව ප්‍රකාශ කිරීමට කතුවරයා යොදා ගෙන ඇත. විරිත ශ්‍රව්‍ය ගෝචර සංකල්ප රූපයක් නිමැවීම සඳහා මැනවින් භාවිතා කොට ඇත. විරිතෙහි යතියත්, පද සංඝටනයත් වීණා වාදනය දසත පැතිරෙමින් සවන්පත් පිනවමින් විසිරී පැතිරී යන ආකාරයත් ශ්‍රව්‍ය ගෝචර සංකල්ප රූපයකට පෙරළයි. ''දිය දිය, ගිය ගිය, සිය සිය'' යනුවෙන් වචන යෙදීමෙන් වීණා වාදනය තරංගාකාරයෙන් පැතිර යන අයුරුත්, ''සපැමිණි, මුතුමිණි, ගෙන මිණි, නික්මිණි, කෙරෙමින්, එන මෙන්'' ගුණයෙන් ආදි තැන්වල යෙදුණු එළිසම මෙන් ම අනුප්‍රාසාත්මක යෙදුම්හි සියුම් ධ්වනියක් ගැබ් ව ඇත. මිණිකැට ගැටෙන්නාක් වැනි වීණා වාදනයෙහි මිහිරියාව එකී වචනයන්ගෙන් මතු වේ. **"පන්සිළු වීණා නද පසු බැස් වූ", ''මනමත් කරවන දන මුළු දෙරණා", නොගොසින් සිට සිටිවන නිබඳේයා"** වැනි පද්‍ය නිර්මාණයන් වුව ද පෙද විරිතෙන් ලියැවී ඇත. ඒවා ද එකී විරිතෙන් ලියැවුණු විශිෂ්ට කවි සංකල්පනා ය.

- ගුත්තිල කාව්‍යයෙහි වඩාත් අවධානය ලක් වූ විරිත වන්නේ සුරඟන රැඟුම සඳහා යොදා ගත් සවිසිමත් විරිත යි. එය වනාහි කවීන් භාවිත කළ සුලබ විරිතක් නොවේ. සුරඟනන්ගේ නර්තන ලාලිත්‍යය කීමට උචිත ම විරිත නම් එම විරිත යි. ගුත්තිල කවියා ඖචිත්‍ය ගුණයෙන් යුතු විරිත් තෝරා ගැනීමට කෙතරම් සූක්ෂ්ම වූයේ ද යන්න මෙකී විරිත තෝරා ගැනීමෙන් විශද වේ. සුරඟනන්ගේ හාවභාව විලාසයත්, බාහිර සැරසිලිත් කදිමට හසු කර ගැනීමට කතුවරයා සමත් වේ. සුරඟනන්ගේ නර්තන ලාලිත්‍යය, ඇස් නැටවීම් අත්පා සෙලවීම් ඈ සෙසු චලනයන් වචනවලට හසු කර ගනී. යොදා ගත් උපමා රූපක, ශබ්දාලංකාර සේ ම විරිත ද එකී වර්ණනය ඉහළට ඔසවා තබයි. පහත පද්‍යය විමසා බලමු.

උදා : **''රූ රැසේ අඳිනා ලෙසේ අත් ලෙළ දි දී විදුලිය පබා - මාත්‍රා 26**



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

රන් රසේ එක් වන ලෙසේ වෙණ නාදනු පා තබ තබා - මාත්‍රා 26
කම් පසේ සැර දෙන ලෙසේ දෙස බල බලා නෙතගින් සබා - මාත්‍රා 26
මම් කෙසේ පවසම් එසේ වර සුර ලඳුන් දුන් රඟ සුබා''- මාත්‍රා 26

එක් පදයක මාත්‍රා විසි හයකි. යති පිහිටා ඇති ආකාරයෙන් අත් පා ඉහළට පහළට එසවෙන ආකාරය පාඨක සිතට සංජානනය වේ. මුල් පාදය පමණක් ගනිමු. 'රූ' යනුවෙන් කියන විට ම අත් එසවෙන ආකාරය ද '**රුසේ**' කියන විට එකී අත් පහළට යන්නාක් මෙන් ද, '**අඳිනා**' යනුවෙන් කියන විට නැවතත් දෑත් දෙපා එසවෙන අයුරු ද, '**දි දී**' යනුවෙන් යෙදෙන විට ක්ෂණික සහ වේගවත් චලනයන් ද සිදුවන ආකාරය ධ්වනිත වේ. මාත්‍රා 2න් 3න් යති පිහිටීම නිසා නර්තනය ලයාන්විත බැව් හැඟී යයි. '**රූ රුසේ අඳිනා ලෙසේ, රන් රසේ එක් වන ලෙසේ, කම් පසේ දෙන සැර ලෙසේ**' ආදි උපමා ද '**තබ තබා, බල බලා, දි දී**' ආදි මිශ්‍ර ක්‍රියා යෝගය ද හලන්ත අකුරු බාහුල්‍යය ද ජීව ගුණයෙන් පිරි වාක්චිත්‍රයක් නිමවයි. '**අත්, රන්, කම්, නෙතගින්, මම්, පවසම්, ලඳුන්, දුන්**' ආදි හලන්ත යෝග සියුම් ශබ්ද ධ්වනියක් මතු කරයි. ඒ සියල්ල ම වරිත ඇතුළෙහි සිදු වීම විශිෂ්ට ය. උචිත වරිත තෝරා ගැනීමෙනි, එකී භාවයන් හොඳින් ම ප්‍රකාශ කළ හැකි වී ඇත්තේ. පහත කවිය ද විමසා බලන්න. ගුත්තිල 'කවියා වචනවලින් සිතුවම් අඳින්නෙකි' ය යන්නට එය ම දෙස් දෙයි.

උදා : ''පිපි සමන් කුසුමන් පටින් තන රන් හසුනු මෙන් මන් බැඳේ - මාත්‍රා 26
ලඹ සවන් දිගු රන් පසින් දන නෙත් මුවන් බඳිමින් තඳේ - මාත්‍රා 26
මඳ පවන් වැද ලෙළ පහන් සිළු මෙන් රැගුම් දෙන රන් බඳේ - මාත්‍රා 26
දිලි ඔවුන් රූසිරි නුවන්වන් බඹ උවත් දැහැනින් මිදේ''- මාත්‍රා 26

ඉහත කවියෙහි දෘශ්‍ය රූපය පාලනය කරන්නේ වරිත ඇතුළත යොදා ඇති පද සංඝටනයයි. 'න්' කාරය අනුප්‍රාසය නර්තනයෙහි රිද්මානුකූලත්වය ක්‍රමික ව ගොඩ නංවයි. **පිපි සමන් කුසු/ මන් පටින් තන/ රන් හසුන් මෙන්/ මන් බැඳේ** ආදි තැන්වල යෙදී ඇති යතියත්, අනුප්‍රාසයත් චලන චිත්‍ර සමූහයක් නිර්මාණය කරයි. දර්ශන ශෘංගාරය මතු වෙයි.

උක්ත නිදර්ශන විමර්ශන කරන කල්හි වැටහෙන්නේ ගුත්තිල කවියා විවිධ අවස්ථාවල පවතින විචිත්‍රත්වය දැක්වීමේ දී යෝග්‍ය පරිදි වරිත වෙනස් කිරීම නිසා ගුත්තිල කාව්‍යය විශිෂ්ට පද්‍ය නිර්මාණයක් බවට පත් වී ඇති ආකාරය යි.

**(වරිත් තුනක් වත් ඇසුරෙන් පිළිතුර ලියා තිබීම ඉහළ ලකුණක් ලබා දීමට ප්‍රමාණවත් ය.)**

(ලකුණු 15යි)

(05) "සමාජයේ පවත්නා විවිධ විශ්වාස හා ඇදහිලි නිසාත්, පාරිසරික හේතු නිසාත් පීඩාවට පත්වන අසරණ ජන කොට්ඨාසයක් පිළිබඳ බැද්දේගම නවකතාවෙන් ඉදිරිපත් කෙරේ.'' නිදසුන් දෙමින් සනාථ කරන්න.

බටහිර යටත් විජිත පාලන සමයෙහි විදේශිකයෙකු අතින් ලියැවුණු නවකතාවක් වූ 'බැද්දේගම' නවකතාව වනාහි හම්බන්තොට දිස්ත්‍රික්කයට අයත් වනගත ව පිහිටි ගමක ඇති තතු ඇති සැටියෙන් කියා පෑ උසස් නවකතාවක් සේ අගය කෙරෙයි. වෙසෙසින් ම නගරයෙන් හුදෙකලා වී වනයක් මැද පිහිටි මේ ගමෙහි මිනිසුන් ගත කළ අර්ධ ශිෂ්ටාචාරික ජීවිතය නවකතාවෙහි නිරූපණය වී ඇත. ලෙනාඩ් සිඩ්නි වුල්ෆ් විසින් ඉංග්‍රීසි බසින් ලියූ මේ නවකතාව සිංහලයට අනුවර්තනය කරන ලද්දේ ඒ. පී. ගුණරත්නයන් විසිනි. විවිධ විශ්වාස හා ඇදහිලි නිසාත්, පාරිසරික හේතු නිසාත් පීඩාවට පත්වන අසරණ ජන කොට්ඨාසයක් පිළිබඳ බැද්දේගම නවකතාවෙන් ඉදිරිපත් කෙරේ.

**සමාජයේ පවත්නා විවිධ විශ්වාස හා ඇදහිලි නිසා පීඩාවට පත් වන ආකාරය**



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

- වනාන්තරයෙහි යක්ෂයන් සිටින බව සිලිඳු දරුවන්ට පවසන අවස්ථාව නූගත්කමත්, මිථ්‍යාවත් ප්‍රකට කෙරෙන අවස්ථාවකි. එනිසා ම වනය ගැනැත්, වනයෙහි යථා ස්වභාවය වටහා ගැනීමටත් සෑහෙන තරම් අධ්‍යාපනයක් නැති වූ විට මෙවැනි අදහස් පළ කිරීම පුදුම විය යුතු කරුණක් නොවේ.

  **"එහෙත් සිලිඳුගේ ලොකුම සන්තෝෂය වුයේ, වනය ගැනත්, තමා දඩයමේ ගිය ගමන් ගැනත්, දිය කඩවල සමීපයේ රාත්‍රියේ රැක සිටි සැටිත්, ගස් සෙවණේ සිටි සතුන් හා යකුන් ගැනත් තම ළමයින්ට විස්තර කර දීම ය...."**

- දරුවන් මිය යන්නේ සිලිඳුගේ ඇස් වහ වැදීමෙන් බව විශ්වාස කිරීමෙන් ගම්වැසියන්ගේ මිථ්‍යා විශ්වාස හා ඇදහිලි කවරාකාරදැ'යි අවබෝධ වේ. වසංගත රෝග සෑදෙන්නේ විවිධ වෛරස් සහ බැක්ටීරියා නිසාත්, අයහපත් සෞඛ්‍ය පුරුදු නිසාත් බව අවබෝධ කර ගැනීමට තරම් අධ්‍යාපනයක් නොමැති නිසා දරුවන් මිය යන්නේ සිලිඳුගේ ඇස්වහ වැදීමෙන් බව ගම්මුන්ගේ විශ්වාසය යි. එනිසා ම සිලිඳු ගැන ඊර්ෂ්‍යාවෙන්, වෛරයෙන් හා ක්‍රෝධයෙන් යුතු ව බැලීමට ගම්වැසියෝ පෙලඹුණහ.

  **"මම හැදුවා ළමයි හය දෙනෙක්: අන්තිම ඒකාමලෙ මේ ඊයෙ. උදේ යසට හිටියා. දොරකඩින් යන කොට උෟ දැකලා සිලිඳු ඇස්වහ ගත්ත. හැන්දෑවේ මළා. උන්ගෙ ළමයි හදන්ඩ අපේ ළමයි මරාදානවා උන්...."**

- පුංචිරාළ වෙදා මන්තර ගුරුකම්වලට දක්ෂ බවත්, ඒවායින් මිනිසුන්ට විවිධ කරදර හිරිහැර කළ හැකි බවත් බැද්දේගම වැසියෝ විශ්වාස කරති. ඒවායෙහි ඇති මිථ්‍යා දෘෂ්ටිකත්වය වටහා ගැනීමට තරම් උගත්කමක් නැති කමින් සිලිඳු අසනීපකාරයකු බවට පත් වන අතර, හින්නිහාමි පුංචිරාළ වෙදාගේ ලිංගික ගොදුරක් බවට පත් වෙයි. පහත දැක්වෙන්නේ පුංචිරාළගේ තර්ජනය යි.

  **"මතක කියා ගනින්, බෝගල ආරච්චිලට වෙච්චි දේ. නුග ගහ යට තවමත් යක්කු නටන වග."**

  **"ඔන්න ආයේ මතක නැති කරන්ඩ එපා. උඹලා ළමයට කියාපල්ලා අර ජා ලමස්සි කෝරාල මහත්තයා ළඟට ගෙන්නුවෙ කොහොමද කියලා"**

  සිලිඳු අසනීප වූවේ පුංචි රාළගේ අපල කිරීමෙන් බව වටහා ගෙන බෙරගම දේවාලයට යන්නේ විශ්වාස හා ඇදහිලිවලට යට වීම නිසා ය.

  **"ඒ දෙවියොන්ගෙ බලේ තියෙන්නෙ කැලේටයි. කැලේ යකුන්ටයි. ඒ දෙවියන්ගෙ උදහසට යක්කු බයයි."**

  **"මිනිහෙකුට යකෙක් වැහිලා හදි හූනියම් කරනවා නම් එයා ඉස්සර වෙලා භාරයක් වෙන්න ඕනැ බෙරගම දෙවියන්ට"**

  සිලිඳු හින්නිහාමිට කැලෙන් ගෙන දුන් මුවා යක්ෂයකු බවත්, එය ගමට අපල ගෙන දෙන බවත් ගම්වැසියෝ විශ්වාස කරති. එකී පිළිගැනීම අවසාන ප්‍රතිඵලය වන්නේ ගම්මුන් හින්නිහාමිට පහර දී මරා දැමීම යි. පුංචිරාළ විසින් මිථ්‍යාව වපුරන ආකාරය පහත දැක්වෙයි.

  **"තව මේ මුවෙක්. උන් නම් කියන්නෙ උෟ කැලෙන් ඇරගෙන ආවයි කියා. එදා රෑ ඈ වැදූ පුතා නොවෙයි? මුවා? යක්සණියො වදන්නෙ නැද්ද? යක්ස පැටවු, ගම්බද ගෑණු මුවන්ට තනෙන් කිරි දෙනවා ද?**

**පරිසරයෙන් පීඩාවට පත් වන ආකාරය**

- **දැඩි නියඟ තත්ත්වය නිසා සෞඛ්‍ය සම්පන්න ආහාර භෝග වගා කර ගැනීමට නො හැකි වීම.**

  වර්ෂයේ වැඩි කාලයක් මුළුල්ලේ පවත්නා නියඟයත්, අධික වාෂ්පීකරණයත් බැද්දේගම වැසියන් කෙරෙහි මහත් පීඩාවක් ගෙන දුන්නේ ය. එබැවින් බැද්දේගම වැසියන්ගේ පරිභෝජනය පිණිස ධාන්‍ය වගා කර ගැනීමත්, පිරිසිදු පානීය ජලය ලබා ගැනීමත් යන මූලික අවශ්‍යතා සපුරා ගැනීම පවා බොහෝ සෙයින් දුෂ්කර විය. ජලය ලබා ගැනීම පිණිස ඔවුහු හැතැප්ම ගණන් දුර ගෙවා ගියහ. ජල සම්පතේ හිඟකම හේතුවෙන් වර්ෂයකට වතාවක් වුව බැද්දේගම වැසියන්ට අසීරුවෙන් වගා කර ගත හැකි වූයේ, අධික උෂ්ණත්වයක් මධ්‍යයේ ජීවත් වන ඔවුන්ගේ ශරීරවලට හිතකර නොවන කටුසර භෝග වර්ග පමණකි.



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources
iexamhub

''අස්වැන්න කපා මිරිකා ගත් පසු මාස කිහිපයක් වන තුරු පමණකි දිනපතා බඩ පුරා කෑමේ ආශ්වාදය ගම්මු ලැබුවේ. හේන් වල වපුරා වගා කර ගන්නා මේ ධාන්‍ය සාමාන්‍යයෙන් මනුෂ්‍ය ශරීරයට හිතවත් ආහාරයක් නොවේ. ඉන් ශරීරයේ ලේ උණුසුම් කරවීමෙන් උණත්, ඉතා භයානක රෝගයක් වන පරංගිත් බෝ වේ.''

වසංගතය අවසන් වන විට ගමේ සිටි හතලිස් එක් දෙනාගෙන් දහසය දෙනෙක් මැරී ගොසිනි. උණෙන් හා අතීසාරයෙන් එහි සිටි පිරිමින් ද ගැහැණුන් ද ළමයින් ද මළායින් පසු කැලය නැග අවුත් එහි තිබුණු ගෙවල් අටෙන් දෙකකට අයිතිවාසිකම් කීහ.''

- වනය ගමේ මිනිසුන්ට හා ගමේ නිවාසවලට කෙරෙන බලපෑම.

"ගම වනයෙන් ම පටන් ගෙන වනයෙන් ම කෙළවර වූයේ ය. වනය ගම වටකර ගෙන, ගමට ඉහළින් ද වැඩෙමින් ගම තද බද කරගෙන සිටියේ ය. ගෙමිදුල් හා එළිමහන් තැන් අකුල් කර ගෙන මැටි ගෙවල් මිරිකා ගෙන මං පෙත් අවුරා ගෙන වනය හාත්පසින් ම වැඩුණේ ය."

බැද්දේගම ගම්මානය අවට පැවතියේ ඝන වනාන්තරයකි. කතුවරයාගේ නිරීක්ෂණයට අනුව එය සෙසු වනාන්තරවලට වඩා බෙහෙවින් ම ගුඪ ස්වරූපයක් උසුලයි. ඕනෑ ම සමතෙකුට වුව දයා විරහිත ව මරණය ළඟා කිරීමේ හැකියාව බැද්දේගම අවට වනාන්තරය සතු විය. අලිකොටිවගවලස් ඈ බද්ධ මෘගයින්ට බැද්දේගම අවට වනාන්තරය නිවහනක් වීය. දෛනික පීඩාවන්ට අමතරව උන්ගෙන් සිදු වන ගැහැටවලින් ද බැද්දේගම වැසියෝ නිරන්තරයෙන් බැට කෑහ.

**(ප්‍රශ්නයේ කොටස් දෙකට ම පිළිතුරු ලිවිය යුතු ය. ඉහත දක්වා ඇති නිදර්ශන ආශ්‍රයෙන් පිළිතුරු ලියා ඇත්නම් ඉහළ ලකුණක් ලබා දිය හැකි ය. වෙනත් ගැළපෙන නිදර්ශන ලබා දී ඇත්නම් ඒවා ගැන ද සැලකිල්ලට ලක් කරන්න.)**

**(ලකුණු 15 යි)**

(06)චරිතවලට ගැළපෙන ලෙස භාෂාව යොදා ගැනීමට කෙටි කතා රචකයන් සුවිශේෂී දක්ෂතාවක් දක්වා ඇති අයුරු නියමිත කෙටිකතා තුනක් ආශ්‍රයෙන් සාකච්ඡා කරන්න.

කකෙටි කතාවක චරිත නිරූපණයට වැදගත් තැනක් හිමි වන්නේ එකී අවස්ථා නිරූපණය කිරීම සඳහා චරිත යොදා ගැනීම නිසා ය. කෙටිකතාකරුවා එකී චරිතවල බාහිර ස්වරූපය පමණක් නොව අභ්‍යන්තරය ද හඳුනාගත හැකි වන අයුරින් භාෂාව භාවිත කොට ඇත. මෙහි දී ඕනෑ ම කෙටිකතා තුනකින් උදාහරණ දැක්විය හැකි ය. පහත දැක්වෙන්නේ එවැනි උදාහරණ කීපයකි.

- මාර්ටින් වික්‍රමසිංහගේ 'වහල්ලු' කෙටි කතාවෙහි උපාලිස්ගේ චරිතයෙහි ඇති විශේෂ ලක්ෂණය වන්නේ 'හඳහා' ගැන ඔහු තුළ ඇති සෙනෙහස යි. එකී සෙනෙහස ඉස්මතු වන ආකාරයෙහි භාෂාවක් යොදා ගැනීමට කතුවරයා සමත්කම් දක්වයි.

  ''වරෙන්...... වරෙන්...... මෙහාට වරෙන්.......'' යි ඔහු සෙමෙන් කීවේ ය.

  හඳයා තම ගාත් දෙකෙන් එකක් සෙමින් තැබුවේය''

  ''උපාලිස් සුරතල් කළේ තමාගේ දරුවන් සමඟ නොව හඳයා සමඟ යග මසකට වරක් තෙල් ගා පිස දමනු ලබන උගේ අඟෙහි කිනිතුල්ලෝ බෝ නොවූහ''

  ''කොන්ද බිඳී ඇඳෙහි වැතිරගන්ට පෙර උපාලිස් සතියකට වරක් හඳයා කරදියෙන් නැවුවේ ය''

  ''ගලක් ගැසූ මෙන් ඒ වේලේම රිය නොනැවතුණි නම් ඒ රිය ගමන් කරන්නේ ඔහුගේ පපුව උඩිනි. රිය නැවතුණේ තමා අපොයි! කියමින් වැටෙන හඬ ඇසූ ගවයා එහෙම ම නැවතුණ හෙයිනි''

- කේ. ජයතිලක මහතා විසින් විරචිත 'නොනිමි සිත්තම' කෙටි කතාව තම චිත්‍ර පන්තියෙහි ඉගෙනුමට ආ මාලනී සමඟ විවාහ වූ අසංග නම් චිත්‍ර ශිල්පියාගේ කුටුම්බ ජීවිතය අර්බුදයට ලක්වන අයුරු පෙන්වා දීම කෙටි



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers   Model Answers - Study Resources

කතාකරුවා තේමාව කොට ගනී. නිශ්චිත පැවැත්මක් නැති පරිසමාප්තියෙන් තොර පුද්ගල ජීවිත ගැන විවරණය වෙයි. කෙටිකතාව නම් කොට ඇත්තේ ද 'නොනිමි සිත්තම' නමිනි. මිනිසාගේ පැවැත්ම ද නොනිමි සිතුවක් වැනි ය. එය සමස්ත කෙටි කතාවෙහි ධාරණය හකුලා දක්වන සංකේතයකි. අසංග, මාලනී, ශීලා ඈ කුමන චරිතයක් වුව ද එවැනි නිශ්චිත පරිසමාප්තියක් නැති චරිත සේ නිරූපිත ය. එකී චරිතවල ගති ස්වභාවයන් ඉස්මතු වන ආකාරයෙහි භාෂාවක් එකී කෙටි කතාවෙහි යෙදී ඇත.

**"එක අතකින් බලන විට ඔහුට දෙගිඩියාව ඇත්තේ මේ චිත්‍රය සම්බන්ධයෙන් පමණක් නොවේ. ඔහුට ඔහුමත් දෙගිඩියාවකි. තමා චිත්‍ර ශිල්පයෙක් ද? නැද්ද? තමා මාලනීට ආදරය කරන්නේ ද? තමා තුළ ශීලා සම්බන්ධයෙන් ඇති වී පවත්නා හැඟීම කෙබඳු එකක් ද?"**

**"මාලනී රක්ෂාවක් කළ නමුත් ගෙදර වියදමට ඇගෙන් සතයක්වත් ලැබුණේ නැත. එසේ වුවත් දිනපතා ඈ ගෙන ගොස් කාර්යාලයට බැස්සවිය යුතු විය. සවස ආපසු කැඳවා ගෙන ආ යුතු විය.."**

**"රත්පැහැ ළා රෝස දල්ලක් මෙන් මෑ සිටියේ මොන තරම් මුදු මොළොක් ගතියකින් ද? කෙමෙන් කටු මෝරා රොස් පරොස් වී ගියේ කී දවසකට ද? චාම් බව අතහැර සංකර ජීවිතයකට ඈ ඇබ්බැහි වන්නට වූයේ කොතරම් ඉක්මනට ද?"**

**"ගුවන් විදුලි වැඩසටහනකට සහභාගී වුවත් ඔහුට එය අසා සිටින ලෙස බලකරන්නී ය. එහි අඩුපාඩු හරි වැරදි අසන්නී ය. හදිසියේවත් ඔහුට සිතෙන අඩුපාඩුවක් සඳහන් කළත් ඈ ඊට එකඟ වන්නේ නැත. ඊට එරෙහි ව තර්ක කරන්නීය."**

**"ඈ පැමිණියේ තවත් මිතුරියන් කිහිප දෙනෙකුන් සමග ඒ කෙනෙකුගේ ම කාරෙකිනි. අසංග දකින විට මාලනීගේ මුහුණ වෙනස් වී ගියේ ය."**

**"ඔහු වැදගත් වැඩක් ඇති බව කියා ඇඳ පැළඳ ගෙන ගෙදරින් යන්නට පිටත් විය. කවුරුනුත් ඔහු දෙස බලන්නට වූයේ විමතියෙනි.... ඈට මහත් සැහැල්ලුවක් දැනුණි.."**

- මහාචාර්ය සෝමරත්න බාලසූරිය විසින් රචනා කරන ලද 'කරත්තය' කෙටි කතාවෙහි උත්ප්‍රාසාත්මක භාෂාවක් යොදා ගෙන ඇත.

  රැකියාව පිළිබඳ ඇති සාම්ප්‍රදායික මතය ගරු නොකරන චරිතයක ලක්ෂණ රණසිංහගේ චරිතයෙන් මතු වෙයි. කතුවරයා කරත්තකරුගේ චරිත ලක්ෂණ යථාර්ථවාදී ලෙසත්, අපූර්ව ලෙසත් ප්‍රතිනිර්මාණය කරයි.

  **"මං සෙනසුරාදාට ඔය ගාවට යනවා ගොනා හොඳට නාවනවා බල්ලත් නාවනවා එතන හොඳ හෙවණ.."**

  **"අද මා මෙහි මුත්‍රා කළත් මගේ බල්ලා මුත්‍රා කරන්නේ බොහෝ ඈතට ගොස් මා දෙස බලා වරදක් නැතැ යි හැඟුණ පසු ය.."**

  **උත්ප්‍රාසවත් සංවාද නිර්මාණය**

  **"තමා ඒ කාලෙ ඔච්චර ඉගෙන ගෙන ඇයි රස්සාවකට නො ගියෙ"**

  **"ඇයි මම රස්සාවක් කරනවා"**

  **"මම අහන්නෙ උගත්කමට ගැළපෙන රස්සාවක්"**

  **"එහෙම එකක් තියෙනව ද?"**

  **"හොඳට හිතා ගන්නවා, අහන දේට විතරක් උත්තර දෙනවා. නිකම් පණ්ඩිතකම් කතා කරල උගත්කම් පෙන්නන්ඩ ගිහින් මැරුම් කන්ඩ එපා. හොඳට හිතා ගන්නවා මේ ඉන්නෙ කොහෙද කියල"**

- දයාසේන ගුණසිංහ විසින් රචනා කරන ලද 'කපිතන්ගේ පුත්තු' කෙටි කතාවෙහි කෙටි කතාවෙහි කපිතන් ජයවීරගේ සිතුවිලි නිරූපණය වන ආකාරයෙහි භාෂාවක් යොදා ගැනේ.

සිදු වීම් මාලාව වර්තමානයෙන් අතීතයටත්, අතීතයෙන් වර්තමානයටත් ගමන් කරනා ආකාරයෙන් ඉදිරිපත් වීම.



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

උදා : "ප්‍රාග් ඓතිහාසික යුගයේ විසූ දැවැන්ත ගොයෙකු සේ ලන්ද මැදින් බඩ ගෑ කපිතන් ජයවීර ආරා වැඩුණු බලුදං පඳුරු අතර වූ හිදැසක් අබියස රැඳී, දෙවැලමිට බිම ඔබා, දෙවුර පොළෝ මට්ටමින් ශේෂයක් ඔසවා, ඒ තුළින් එබී බැලී ය.''

උදා : "නාකඳ... නාකඳ.. නාකඳ ? කටුක අව්වට තෙත සිඳී ගල් පොත්තට ම ඇලී අතුරුදන් වූ මී මල් පොද වැස්සට පෙඟී මතු වූ පරිදි කාලයෙන් වියැළී ගිය ඔහුගේ ළමා වියේ යම් යම් සිද්ධීන් යළි බිහිවීමට වෙර දරයි."

උදා : "ඈත පෙනෙන නා කඳින් එගොඩ වී අතීතයේ දිනෙක පාසල් ගිය බවක් මෙනෙහි කරන ඔහු එදින සොම්නසින් ඉපිලී හිනැහෙමින් නටමින් තමා කැටුව ගිය කොලු කරුට්ටන්...''

උදා : "ඩේව... ඩේව... ඩේව...'' යනුවෙන් ප්‍රතිරාවය කරමින් අතීත ස්මරණයෙන් යුතුව ඒ නම දිව ගා බැලූ කපිතන් තැනට, පළමුව ඩේවියා වී දෙවනුව ඩේවා බවට පරිණාමය වූ ඩේවිඩ් කෙනෙකු ගැන මෙනෙහි විය.''

කපිතාන්ගේ මනෝවිකාරයක් ලෙස දිග හැරෙන කෙටි කතාවෙහි අවසාන කොටස ඉතා විශිෂ්ට නිරූපණයකි. කපිතාන්ගේ සංවේදී මනසත්, පශ්චාත් - තාපයත්, වරදට වන්දි ගෙවීමත් පිළිබඳ ප්‍රකාශ කෙරෙන එකී අවස්ථාව ජයවීර ගැනත්, විප්ලවාදීන් ගැනත් අනුකම්පාවක් ජනිත වන අවස්ථාවකි.

"ඇයි උඹ මගේ පුතාව මැරුවෙ"

"නෑ ඩේවො, මම නෙවෙයි"

"නෑ ! උඹ මැරුවෙ නෑ..."

"අනේ වෙඩි තියන්න එපා ඩේවෝ ! එක වැදුණ ම පුපුරු ගහනවා.."

"එහෙනම් උඹ මගෙ පුතාට වෙඩි තිබ්බෙ.."

"අනේ ඩේවො.. තියනවනන් කකුලට තියපං.."

"කකුල ? කකුලට නෙවෙයි. උඹේ ඔළු ගෙඩියට තියන්න ඕනෑ. උඹ දන්නව ද? මම ඌව හදපු අමාරුව. ඌට අම්මෙක් හිටියෙත් නෑ. වෙන කවුරුවත් හිටියෙත් නෑ. හන්දියෙ මුට්ට කර ගහල මං ඌව හැදුවේ. උඹ ඌව එක ඇඟිල්ලකින් මරල දැම්මා. ඇයි උඹ ඌව මැරුවෙ ?"

"නෑ ඩේවො, මම මැරුවෙ උඹේ පුතාව නෙවෙයි.."

"එහෙනම් කවුද අතන පස් කාගෙන මැරිල හිටියේ..."

"ඒ මගේ පුතා ඩේවො? ඒ මගේ පුතා"

මරණාසන්න මොහොතෙහි ජයවීරගේ සිත ය මේ ඉදිරිපත් වන්නේ. එක අතකින් කපිතාන්ගේ සංවේදී මනස මෙහි දී අනාවරණය වෙයි. තමා අතින් මරුමුවට පත් වූයේ දුප්පත් පීඩිත පන්තිය නියෝජනය කරන පරාර්ථකාමී තරුණයෙකි. එය තම දරුවාගේ මරණයටත් වඩා වේදනාකාරී මරණයක් වෙයි. මැරී ඇත්තේ කවරෙකු දැ'යි ඇසූ විට, "ඒ මගේ පුතා ඩේවො ? ඒ මගේ පුතා" යනුවෙන් කෙරෙන ප්‍රකාශය එක් අතකින් කපිතාන්ගේ සිතෙහි ඇති වේදනාව ගම්‍ය කරන යෙදුමකි.

- සයිමන් නවගත්තේගම මහතාගේ 'ස්නේහය' කෙටි කතාවට තේමාව වන්නේ දෙමාපිය යුවලකගේ සිත්හි ජනිත වන දාරක සෙනෙහස යි.

රංකිරාගේ සහ පිංචි මහයියාගේ සිතෙහි තම දරුවා ගැන ඇත්තේ අසීමිත සෙනෙහසකි. දරුවා ශිෂ්‍යත්වය සමත් වී ගමෙන් පිට වෙයි. එදා සිට අද දක්වා තම දරුවා ගැන ඇති ආදරයෙන් සිත පුරවා ගෙන රංකිරාත්, පිංචි මහයියාත් කල් ගෙවති. ඔවුහු දැන උගත්කමක් නැති, හද්දා පිටිසරට පුරුදු වූ ජීවිත ගෙවන්නෝ ය. එබැවින් ඔවුන්ට ගමෙන් එපිට සිදු වන දේ ගැන අවබෝධයක් නැත. ඔවුන්ට ඇත්තේ දරුවා පිළිබඳ ඇති නිර්මල, අව්‍යාජ සෙනෙහස පමණකි. පහත උපුටනය විමසා බලමු.

"ඇයි මතක නැද්ද ?" ඈ පැදුර වියමින් කතා කරයි. "පුතාලෑ තාත්තට මතක නැද්ද ? ඒ ලියමන එව්වෙ ගිය අවුරුද්දෙ අලුත් අවුරුද්දට සුමානෙකට කලින් අලුත් අවුරුද්දට එන්ඩ විදියක් නෑ කියල."



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub

ඔවුන්ට සිටින්නේ එක ම දරුවෙකි. දරුවන් හත්දෙනෙකු ම වලිප්පුව හැදී මිය යන අතර මේ කියන දරුවා ඔවුන් හදා ගන්නේ දහ අතේ වියදම් කොට නිමක් නැති දුක් විඳ ය. දරුවා ඔවුන්ගෙන් ඈත් වන තෙක් ඔවුන් ගත කොට ඇති ජීවිතය තෘප්තිමත් එකක් බැව් පිංචි මහයියාගේ සිතුවිලිවලින් ම ප්‍රකාශ වෙයි. කෙටිකතාවෙහි අවසානය වුව ද වේදනාබර ය. තම පුතා ගුවන් විදුලියෙන් රට ම අමතා ඇතැයි දැන ගත් පසු පිංචි මහයියාගේත්, රංකිරාගෙත් හැසිරීමෙන් ඔවුන්ගේ මානසික හුදකලාවත් දරුවා ගැන හදෙහි පිරිතිරෙන සෙනෙහසත් මතු වෙයි.

"ඒක නෙමෙයි උඹලට ආරංචි නැද්ද ?"

"මොකක්ද මැණිකේ !"

"ඊයේ හැන්දෑවේ උඹලගෙ පුතා කොළඹ ඉඳලා වැර්ලස් එකෙන් මුළු ලංකාවටම කතාවක් කෙරවලු."

මේ කියන්නේ කුමක්දැයි වටහා ගන්නට බැරුව මොහොතක් වෙලා පිංචි මහයියා මැණිකේගේ මුහුණ දිහා බලා සිටියා ය.

"වැර්ලස් පුතා ලංකාවටම ?"

"ඔව් .. ගමේ ඉලංදාරි ඔක්කොම අහගෙන ඉඳලා තියෙනවා. වානේ කඩේ විතරනෙ වැර්ලස් එකක් තියෙන්නේ.. මාත් අපේ මුදලාලිට...."

**(ඉහත දක්වා ඇති උදාහරණවලට අමතර ව, වෙනත් කෙටි කතාවලින් උදාහරණ ගෙන සාකච්ඡා කොට ඇත්නම් යොමු ඉහළ ලකුණක් ලබා දීමට හැකි ය.)**

(ලකුණු 15 යි)

(07) ප්‍රේමයේ රමණීත්වයත්, එහි කටුක වේදනාවත් කලාත්මක අයුරින් ප්‍රතිනිර්මාණය කිරීමට නූතන කවීන් සමත් වී ඇති ආකාරය නූතන පද්‍ය සංග්‍රහයේ පද්‍ය පන්ති තුනක්වත් නිදසුන් කොට ගනිමින් පහදන්න.

ප්‍රේමය විවිධාකාරය. ස්ත්‍රී-පුරුෂ ප්‍රේමය, සහෝදර ප්‍රේමය, දෙමාපිය-දූදරු ප්‍රේමය ආදි අයුරින් ප්‍රේමය විවිධ ය. නූතන කවියා එකී ප්‍රේමයෙහි රමණීයත්වයත්, එහි කටුක වේදනාවත් කලාත්මක අයුරින් ප්‍රතිනිර්මාණය කිරීමට සමත් වී ඇති අයුරු නිර්දිෂ්ට පද්‍ය සංග්‍රහයෙහි ඇති පද්‍යවලින් නිරූපණය වී ඇති ආකාරය මෙකී පිළිතුරෙහි අන්තර්ගත විය යුතු ය.

- පරාක්‍රම කොඩිතුවක්කු කවියාගේ **'දේදුන්න පාලම හෙටත් පාලම උඩින්'** පැදි පෙළෙන් ස්ත්‍රී-පුරුෂ ප්‍රේමයෙහි කටුක වේදනාව ද, මහගමසේකරගේ **'මාර යුද්ධය'** පැදි පෙළෙන් යශෝධරා කුමරිය සහ සිද්ධාර්ථ කුමාරය අතර තිබූ ප්‍රේමයෙහි රමණීයත්වය හා වෙන් වීමෙන් ඇති වූ වේදනාව ද, දයාසේන ගුණසිංහයන්ගේ **'රන් තැටියක කඳුළු'** පැදි පෙළෙන් අලුත උපන් බිළිඳව ප්‍රසූතාගාරය තුළ ම මිය ගිය විට පියෙකුගේ සිත තුළ ඇති වන වේදනාත්මක සිතුවිලි ද, ධර්මසිරි රාජපක්ෂ කවියාගේ **'නංගිගේ රහසිගත සෙනෙහෙ වීණාව'** පැදි පෙළෙන් සහෝදර ප්‍රේමයෙහි රමණීයත්වය ද, බුද්ධදාස ගළප්පත්ති කවියාගේ **'දුරු රට ගිය පුතු'** පැදි පෙළෙන් තම පුතා විදේශ රටකට යාම නිසා පියෙකුගේ සිතෙහි ඇති වන වේදනාත්මක සිතුවිලි ද ලාල් හෑගොඩ කවියාගේ **'සතුට'** පැදි පෙළෙන් අනිර්වචනීය ප්‍රේමයෙහි සෞන්දර්යය ද කලාත්මක ව නිරූපණය වෙයි.

- පරාක්‍රම කොඩිතුවක්කු කවියාගේ **'දේදුන්න පාලම හෙටත් පාලම උඩින්'** පැදි පෙළ

දේදුන්න පායාවි හෙටත් පාලම උඩින් පද්‍ය පන්තියට විෂය වන්නේ ප්‍රේම වියෝගය නිසා කථකයකු තුළ ඇති වන දුක්ඛ සන්තාපය සහ මානසික කම්පනය විවරණය කිරීම යි. විප්‍රලම්භ ශෘංගාරය පැදි පෙළෙන් ඉස්මතු වෙයි.



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources
iexamhub

"සුරලා ගෙන යන්න මා හදේ පිපුණ මල්" යන යෙදුමෙන් බිඳ වැටුණු ප්‍රේමයෙහි කටුක වේදනාව ද, සබඳතා බිඳ වැටුණත්, එකී ආදරයෙන් ගොඩ නැඟුණු ජීවිත සෞන්දර්යය ඔහුගෙන් දුරස් නොවන බව **"මල් නඟන වසන්තය ඔබට ගෙන යා හැකි ද** "යන යෙදුමෙන් ප්‍රකට කෙරෙයි. කථකයා එදා විඳි ප්‍රේමානන්දය අද අත්විඳිය නොහැකි ය. ඒ වේදනාව ඔහුට දැනෙයි; හැඟෙයි; රිදවයි; හඬවයි. **"දේදුන්න පායාවි හෙටත් පාලම උඩින් ඔබ නැතත් මම එතැන පාට හත ගනින්නම්", "ඔබ යන්න මධුරතර සප්ත ස්වරය අරන්" "ඔබ යන්නෙ මහද තෙත් වැහි වලාකුළ අරන්"** යන යෙදුම් ඇගේ වියෝවෙන් ඔහු තුළ ඇති වූ වේදනාව, කම්පනය ධ්වනිත කෙරෙයි. දේදුන්න වනාහි සංකේතාත්මක ය. දේදුන්න නම් මොහොතක ඇති වී මොහොතකින් නැති වී යන වර්ණාවලියකි. භාවාතිශය ප්‍රේමය එයින් සංකේතවත් වේ. සූර්යාලෝකය අභියස දේදුන්න වියැකී යයි. දේදුන්නේ වර්ණාවලියෙන් සංකේත වන්නේ ප්‍රේමයෙහි රමණීයත්ව යි. සූර්යාලෝකය අභියස දේදුන්න වියැකී යන බව අපි දනිමු. එයින් ප්‍රේම වියෝගයෙහි කටුක වේදනාව ධ්වනිත වෙයි.

- මහගමසේකරගේ **'මාර යුද්ධය'** පැදි පෙළ

දුෂ්කර ක්‍රියාවට සිත් යොමු කරන කල්හි යශෝධරා කුමරිය අමතක කිරීමට නො හැකි ව ළතැවිලි සහගත සිතුවිලි පිරි සිද්ධාර්ථයන්ගේ චිත්ත අභ්‍යන්තරය 'මාර යුද්ධය' නම් පැදි පෙළෙන් විවරණය වෙයි.

- ✓ 'මාර යුද්ධය' යන මාතෘකාව ධ්වනි පූර්ණ ය. එයින් ධ්වනිත වන්නේ යශෝධරා කෙරෙහි ඇති දැඩි සෙනෙහස යි. සිද්ධාර්ථයන් යුද කරන්නේ තම සිත සමඟ ය.
- ✓ **"ඔබ මා වෙන දයා සිතින්", "ඔබ ගතෙහි මුදු මෙලෙක", "තදින් දැනෙයි ඔබේ ගුණය"** වදන්වලින් යශෝධරාව කෙරෙහි සිදුහත් කුමාරයාගේ සිතෙහි ඇති ආදරය, භක්තිය ධ්වනිත කෙරෙයි.
- ✓ **"ඔබෙන් දුරුව සිටිනා මට**
  **තදින් දැනෙයි ඔබේ ගුණය**
  **එතෙක් දවස් මා තුළ වූ**
  **කලකිරීම**
  **යසෝදරා කුමාරියනි**
  **දැන සිටියේ ඔබ පමණ ය"** වැනි පද පෙළක වන බස්වහරින් සහෘද චිත්තයන්හි යසෝදරාව හා සිදුහත් කුමරුන් අතර වන ආධ්‍යාත්මික ප්‍රේමය මැනවින් ධ්වනිත කෙරේ.

- දයාසේන ගුණසිංහයන්ගේ **'රන් තැටියක කඳුළු'** පැදි පෙළ

'රන් තැටියක කඳුළු' පැදි පෙළෙන් ප්‍රසූතාගාරයේ දී මිය ගිය තම දරුවා මිහිදන් කොට පිටත් වන පියකුගේ සිතුවිලි විවරණය වෙයි. 'රන් තැටියක කඳුළු' යන යෙදුම ම ප්‍රතිභාන්විත යෙදුමකි. හඳ මාමා රන් තැටියෙන් කිරි පැණි ගෙන දරුවන් සනසන බව ය අප අසා ඇත්තේ. එහෙත් එකී රන්තැටියෙහි දැන් ඇත්තේ කඳුළු ය. සඳ ද වැලපෙයි. ශෝක රසය ම ජනනය වෙයි. වාංමලාවෙහි තැවරී ඇත්තේ පාළුව, ශෝකය හා වේදනාව යි. එක් අතකින් දෙමාපියන්ගේ බිඳුණු බලාපොරොත්තු ය. තවත් පසෙකින් කුසින් බිහි වූ නමුත් හුස්ම නොවැටෙන බිලිඳාගේ මළ සිරුර ය. පාඨකයා ශෝක රසයෙන් පුරවාලයි.

**''මොහොතකින් සඳ ඒවි තනියට**
**රන් තැටිය පුරවා කඳුළින්''**

**''සෙමෙන් තව තව සෙමෙන්**
**පස් පිඩැලි පෙරළන්න**
**මවගෙ ඇකයෙහි පහස**
**දැරියකි සිඟිති''**

**''බිඳී සුන් වන ලොවක''**



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources
iexamhub

''බිහි නොවූ හෙට දවස''

''අඳුරු සෙවණැලි අතර''

තම දියණියන් උපන් ගෙහි ම මරණයට පත් වූ විට පියෙකුගේ සිතෙහි ඇති වන කටුක වේදනාව පැදි පෙළෙහි අන්තර්ගත වෙයි.

- බුද්ධදාස ගළප්පත්ති කවියාගේ **'දුරු රට ගිය පුතු'** පැදි පෙළ

**බුද්ධදාස ගලප්පත්ති කිවිඳුන් විසින් ලියන 'දුරුරට ගිය පුතු' නම් පද්‍ය පන්තිය සිය පුතු තම පරම හිත මිතුරා ව සිටි පියෙකු පුතු විදේශගත වීමෙන් හටගන්නා හුදකලා බවින් වේදනාවට පත් ව ඇති ආකාරය ඉදිරිපත් කරන්නකි.** පුතුගේ දුරස් වීමෙන් කම්පාවට පත් පියාගේ හැඟීම් ප්‍රකට කරනු වස් යොදා ගෙන ඇති යෙදුම් තුළින් එබැව් සනාථ වේ.

**"හිරු එළිය ගලා එයි කුටියට**

**කවුළු පියන්පත් අතරින්"**

**"ඇසෙන නෙක විහඟ ගී නද**

**අලුයමින් පෙරදා ලෙස"**

**"පිපී අතු අග නෙක මල්**

**සැලෙනා නමුදු මඳ පවනේ"** වැනි යෙදුම් ඊට දෙස් දෙයි. පද්‍ය පන්තිය පුරාවටම කථක පියා අත්විඳින හුදකලාව, පාළුව, ශෝකය ධ්වනිත කිරිමට සමත් බස් වහරක් ගළපා ගෙන ඇති අන්දම හඳුනා ගත හැකි ය.

**"ඒ හිරු එළිය අද දින**

**මලානික වී"**

**"හද සැනසූ සුවඳ පෙර දින**

**නොදැනෙන්නේ කිම ද අද දින"**

**"වෙළාගෙන මා ගත සිත**

**පාළුව ගලා විත් මා වට කොට"**

**"නොගෙනෙන්නේ කිම ද කිසි මිහිරක්"** වැනි පද්‍ය ඛණ්ඩයන් තුළින් කථකයා අත්විඳින පාළුව, ශෝකය ධ්වනිත කෙරේ. ස්වභාව ධර්මය පියාගේ පාළුව, ශෝකය ධ්වනිත කිරීම භාවිත කොට ඇත. කවියා පවසන්නේ පෙරදා අලුයමින් සිතට මිහිරක් කැන්දන සුමියුරු විහඟ නද පවා අද හදට රිදුමක් මිස කිසිදු රසයක් නො ගෙනෙන බව යි. ප්‍රියයන්ගෙන් වෙන් වීම කෙතරම් දරුණු වේදනාවක් ද යන්න ප්‍රකට වන්නේ මෙකියන පියා පෙරදා විඳි ස්වභාව සෞන්දර්යයන් අදත් එලෙසින් ම පැවතිය ද පෙරදා ඔහු අත්විඳි මිහිරියාව අද නොදැනෙන නොහැගෙන බව කීමෙනි.

**"පිපී අතු අග නෙක මල්**

**සැලෙනා නමුදු මඳ පවනේ**

**හද සැනසූ සුවඳ පෙර දින**

**නොදැනෙන්නේ කිමද අද දින"** එදා මෙන් අද ද අතු අග නෙක මල් පිපී සැලෙයි. එකී මල් සුවඳ අද ඔහුට නො දැනේ. කොතෙක් මල් පිපී සුවඳ හැමුව ද පියාට සුවඳ නොදැනෙන්නේ සුවඳෙහි විපර්යාසයක් හෝ පියාගේ වරදක් නොවේ. එයින් හැගෙන්නේ තම පුතුගේ දූරස්ථ භාවයෙන් පියා අත් විඳින වේදනාව යි; හුදකලාව යි; චිත්ත පීඩාව යි.



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources

- ධර්මසිරි රාජපක්ෂ කවියාගේ **'නංගිගේ රහසිගත සෙනෙහෙ වීණාව'** පැදි පෙළ

ධර්මසිරි රාජපක්ෂයන්ගේ 'නංගිගේ රහසිගත සෙනෙහෙ වීණාව' නමැති පැදි පෙළ රබර් කිරි කැපීමේ රැකියාවේ නියුතු නැගණි කෙනෙකුගේ රහසිගත ප්‍රේමය විෂයෙහි අයියාගේ සිතෙහි ඇති වන ළෙන්ගතු හැඟීම් විවරණ කිරීම වස්තු විෂය කර ගනී. මෙකී පැදි පෙළෙහි ප්‍රේම වෘත්තාන්ත දෙකක් පිළිබඳ ඉඟි කෙරේ. එනම්,

1. නංගීගෙන් දුරස් ව සිටිය අයියාගේ සිතෙහි නැගණියන් ගැන ඇති ප්‍රේමය.
2. නංගීගේ සිතෙහි ඇති අයියා නොදත් රහසිතග ප්‍රේමය

කිරි පිහිය මුවහත් කිරීමට බොහෝ වේලාවක් ගත නොවේ. එහෙත් නංගී එකී කාර්ය කරන අතර ම මනෝමය ප්‍රේමයෙහි පැටලේ. තම ප්‍රේමය සිතින් ආස්වාදය කරන අයුරු **''සඳ පහන සේ ආදරයෙන්,'' ''වීණාව වය වයා''** වැනි යෙදුම්හි ගැබ් ව ඇත්තේ ය. සඳ යන යෙදුම කේන්ද්‍රීය යෙදුම ප්‍රේමයෙහි ළතෙත් බව ධ්වනිත කිරීම සඳහා භාවිත කොට ඇත. පහත දැක්වෙන්නේ එවැනි යෙදුම් කීපයකි.

**"ගෙයින් පිට රැළි ගසන සඳ වතුර ය"**

**"නිදිමත ආනන්දයෙන් චමත්කාරය වගුළ**
**සඳ පහන උරා මත් වූ ගමේ රබර් යාය"**

**"සොඳුරු වූ රහසිගත සෙනෙහෙ වීණාව ගෙන**
**සඳ පහන සේ ආදරෙන්**
**වය වයා''**

**"මාත් වාඩි කරගනු මැන ඔය සඳ යට ම නැඟණියනි"** වැනි යෙදුමකින් ඉස්මතු වන්නේ උක්ත කී සෙනෙහස යි. අයියාට අවැසි වනුයේ නැගණියන් අසල සිටීමටයි'. එකී හැඟීමට දැඩි සෙනෙහස හැර අන් කුමන නාමයක් ලබා දිය හැකි ද?

✓ 'රහසිගත සෙනෙහෙ වීණාව' යන රූපකය ප්‍රබල ධ්වනියක් නංවයි. වීණාවෙහි නාදය සුමිහිරි ය. එයින් ම සෙනෙහසෙහි ඇති මිහිර කවරාකාරදැයි ඉඟි කෙරේ. එහෙත් එය රහසිගත ය. එය රහසක් ව රැක ගන්නේ කවර හේතු නිසාදැයි යන්න අවිශද ය.

✓ අයියා තුළ නැඟණියන් කෙරෙහි වන දැඩි සෙනෙහස තීව්‍ර කරනු පිණිස **"නැඟණියනි"** යන තැන ගෞරවාර්ථ තද්ධිත ප්‍රත්‍යය යොදා ගෙන තිබෙනු පෙනේ.

- ලාල් හෑගොඩ කවියාගේ **'සතුට'** පැදි පෙළ

පැදි පෙළෙහි මාතෘකාව 'සතුට' යන්න යි. සිරිපා වන්දනාවේ නිරත තරුණියකුගේ සිතෙහි පහළ වන අනිර්වචනීය සන්තුෂ්ටිය පැද පෙළට විෂය වෙයි. කථකයා මුල්වරට සිරිපා කරුණා කළ අයෙකු විය යුතු ය. ඔහුගේ සිතෙහි සතුට ඇති කරවන දෑ මොනවාදැ'යි පැදි පෙළෙහි සාකච්ඡා කෙරේ. ඒවා මුල් වරට කථකයාට මුණ ගැසුණු දෑ විය යුතු ය.

✓ කථකයාගේ සිතෙහි විවිධ ආරම්මණ පහළ වෙයි. ඒවා සියල්ල අලුත් ය. ඒවා කථකයාට අපමණ සතුටක් ගෙන දෙයි. එකී සතුට, **"අලුත් ලෙයක් නහරවැල් දිගේ ගලයි  අලුත් මල් පිපී තිබේ නම් නොදත් අලුත් ලයකි..."** වැනි යෙදුම්වලින් ධ්වනිත වෙයි.

✓ **'අලුත්'** යන යෙදුම තෙවරක් ම යොදා තිබීමෙන් කථකයාගේ සතුට කවර තරම් දැ'යි පාඨකයාට වැටහෙයි. **'අලුත්' මල් පිපී තිබේ'** යන පාඨය විවිධ ධ්වනි නංවයි. කථකයා යෞවනයෙකි. **'අලුත් මල්'** වනාහි නාඳුනන නව යෞවනියෝ ය. එවැනි තරුණියන් දකින කථකයාගේ සිතෙහි ඇති වන සතුට අනිර්වචනීය ය.

✓ පැදි පෙළෙහි අග මුල විමසා බලන කල්හි වඩාත් පැහැදිලි වන කරුණක් ඇත. එනම්, ඔහුට සතුටු අරමුණක් ඇති බව යි. ඒ අරමුණු කුමක්දැ'යි කියැවෙන්නේ පද්‍ය පන්තිය අවසානයෙහි ය. **'දුම්බර සිට ආ නඩයක් මැද හිඳ**



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers · Model Answers · Study Resources

**සිනාසුණා දැරියක්'** මෙය ඔහුගේ සතුටට හේතුව විය නොහැකි ද? එනම්, ප්‍රේමය විෂයයෙහි පහළ වන සතුට යි.

මීට අමතර ව, 'වන්නියේ හැන්දෑව, 'අඩ සඳ', 'පොඩි දුවේ' යන පද්‍ය පන්ති ද, තර්කානුකූල ව ගැළපීමට හැකියාව ඇත. ඒවා ගැන ද සලකා බලන්න.

**(ඉහත දක්වා ඇති පද්‍ය පන්ති තුනක් ආශ්‍රයෙන් ලියා තිබීම ඉහළ ලකුණක් ලබා දීමට ප්‍රමාණවත් ය.)**

(ලකුණු 15යි)

(08)''**පෙමතො ජායතී සොකො**' නාට්‍යය වඩාත් රසවත් දෘශ්‍ය කාව්‍යයක් බවට පත් වන්නේ එහි උපයුක්ත ගීතවත් භාෂාව හේතුවෙනි.'' නාට්‍ය පෙළ ඇසුරෙන් විමසන්න.

- මහාචාර්ය සරච්චන්ද්‍රයන්ගේ කවර නිර්මාණයක වුව ද දක්නට ලැබෙන විශේෂ ලක්ෂණයක් වන්නේ ඔහු විසින් භාවිත කරනු ලබන භාෂාව උසස් කාව්‍යමය වින්දනයක් අත්පත් කර දීම යි. ඔහුගේ නවකතාවල භාෂාව ගීතාත්මක ය; ළගන්නා සුලු ය. නාට්‍යයක භාෂාව ගීතවත් විය යුතු යැ'යි අත්පත් කර දෙන්නක් විය යුතු යැ'යි නීතියක් නැත. එහෙත් සරච්චන්ද්‍රයන්ගේ බොහෝ නාට්‍යවල නාට්‍ය පෙළවල් උසස් කාව්‍යමය වින්දනයක් අත් පත් කර දෙන නාට්‍ය පෙළවල් ය. මනමේ, සිංහබාහු ඈ නාට්‍යවල පවා නාට්‍ය පෙළගීත රසයක් ප්‍රේක්ෂකයාට අත්පත් කර දෙයි. 'පෙමතො ජායතී සොකෝ' නාට්‍ය රංග ගත කෙරෙන්නේ ගීත නාට්‍යයක් ලෙස ය. ගීත නාට්‍යයක ස්වරූපය වන්නේ එකී සංවාද ගීත ලෙස ඉදිරිපත් වීම යි. එබැවින් 'පෙමතො ජායතී සොකො' නාට්‍ය පෙළ වඩාත් රසවත් දෘශ්‍ය කාව්‍යයක් බවට පත් වී ඇති අයුරු හඳුනා ගත හැකි ය. පහත දැක්වෙන්නේ පිළිතුර ලිවීම සඳහා ගත හැකි එවැනි නිදසුන් අවස්ථා කීපයකි.
- සංවාද සමාන මාත්‍රා ගණනකින් යුක්ත පාදවලින් සමන්විත ය. ඒ නිසා ම පද සංඝටකයේ දී ශ්‍රැති රම්‍යභාවයක් නිරායාසයෙන් ඇති වේ.

  ''**අද යමියි හෙට යමියි** - **මාත්‍රා 10**

  **ඔබතුමා කියන මුත්** - **මාත්‍රා 10**

- යම් හැඟීමක් වාච්‍යාර්ථවලින් ප්‍රකාශ කරනවාට රසවත් ව ප්‍රකාශ කිරීම උදෙසා භාවිතා කරන භාෂාත්මක යෙදුම් කාව්‍යෝක්ති නම් වේ. එවැනි කාව්‍යෝක්ති 'පෙමතො ජායතී සොකො' නාට්‍ය පෙළෙහි දක්නට ලැබේ. එවැනි කාව්‍යෝක්තිවලින් ගීත රසය ඇති කරයි.

  ''**ගල් වැඹක් සේ නොසැලෙන අප**

  **ඇඳුරුතුමා අද පරඬැලක් සේ....**''

- උපමා රූපක භාවිතා කොට රසවත් වින්දනයක් අත්පත් කර දීම.

  ''**ළඳකගේ ඇස් මිණි පහන් ලෙස**

  **දිලෙන බව නෙත් කවින් ගී බස....**''

- දෙබස් හා සංවාද ධ්වනිතාර්ථ මෙන් ම සංකේතාර්ථ සහිත බව.

  ''**යෞවනයේ සුවඳ මල් ද**

  **යෞවනයේ මිහිරි පල ද....**''

- අනුප්‍රාසය හා එළිසමය සහිත සුලලිත පද සංඝටන යොදා තිබීම ගීතවත් බව ඇති කිරීමට හේතු වෙයි.

  ''**ස්වර්ණතිලකා වීය ඇගෙ නම**

  **ස්වර්ණවර්ණය ඇගේ දේහය**

  **ස්වර්ණමාලා කළඹ සඳසිය....**''

**('ප්‍රේමතෝ ජායතී සෝකෝ' නාට්‍යයෙහි ඇතුළත් ඉහත දක්වා ඇති උදාහරණ ඇසුරෙන් පිළිතුර ලියා ඇත්නම් ඉහළ ලකුණක් ලබා දිය හැකි ය.')** (ලකුණු 15 යි)



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources
iexamhub

# බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව


## අ. පො. ස. (උ. පෙළ) විභාගය-2026

## (තෙවන වාර පරීක්ෂණය)

## 71 - සිංහල II

**ලකුණු දීමේ පටිපාටිය**

**සියලු ම හිමිකම් ඇවිරිණි**



**(මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි.)**



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

**බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තුමේන්තුව - 13 ශ්‍රේණිය**

**තෙවන වාර පරීක්ෂණය**

**71 - සිංහල II පත්‍රය**

**ලකුණු බෙදී යාම**

I කොටස (පළමුවන ප්‍රශ්නය) : මෙම ප්‍රශ්නය වරණ 05 බැගින් වූ බහුවරණ ප්‍රශ්න 20කින් සමන්විත ය. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතු ය. මෙහි එක් ප්‍රශ්නයකට ලකුණු 01 බැගින් ලකුණු 20කි.

II කොටස (පළමුවන ප්‍රශ්නය) : මෙම කොටස ප්‍රශ්න වරණ 07කින් සමන්විත ය. දෙවන හා තෙවන ප්‍රශ්න අනිවාර්ය වන අතර, එකී ප්‍රශ්න දෙක සහ 04 සිට 08 දක්වා ප්‍රශ්නවලින් ප්‍රශ්න දෙකක් තෝරා ගෙන ප්‍රශ්න හතරකට සම්පූර්ණයෙන් පිළිතුරු සැපයිය යුතු ය.

02 ප්‍රශ්නය : (අ) අවබෝධය - ලකුණු 12 යි. (02 × 06 = 12 යි)

(ආ) සාරාංශය - ලකුණු 13 යි. (02 + 03+ 08 = 13 යි)

03 ප්‍රශ්නය : රචනය - ලකුණු 25 යි.

04 වන ප්‍රශ්නයේ සිට 08 වන ප්‍රශ්නය තෙක් - ලකුණු 15 යි

II **වන පත්‍රය සඳහා මුළු ලකුණු** 20 + 25 + 25 + 15 + 15 = 100

අවසාන ලකුණු ගණනය කිරීම

I **වන පත්‍රය සඳහා මුළු ලකුණු** = 100

II **වන පත්‍රය සඳහා මුළු ලකුණු** = 100

**අවසාන ලකුණ** = 200 ÷ 2 = 100

**අභිමතාර්ථ**

## II පත්‍රය - I කොටස

- සිංහල අක්ෂර මාලාව, ඊට අයත් විවිධ ප්‍රභේද, පද සංයෝජනය, උක්තාඛ්‍යාත රීති හා භාෂාවේ ප්‍රමුඛ ව්‍යාකරණාංග පිළිබඳ විභාග අපේක්ෂකයන් සතු අවබෝධය විමර්ශනය කිරීම මින් අපේක්ෂිත ය.

## II පත්‍රය - II කොටස

- අපේක්ෂකයන් සතු සංශ්ලේෂණ හා විශ්ලේෂණ ශක්‍යතාව ද විචාරශීලී චින්තනය, නිර්මාණාත්මක කුශලතා මෙන් ම අනිර්දිෂ්ට ගද්‍ය පාඨවල අර්ථාවබෝධය මැන බැලීම ද, වාක්‍ය රීති, ප්‍රමුඛ ව්‍යාකරණාංග හා ශිල්පීය ලක්ෂණ පිළිබඳ කුසලතා විමර්ශනය කිරීම ද මේ කොටසින් අපේක්ෂිත ය.



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

# ලකුණු දීමේ පටිපාටිය

## I කොටස

| ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය | ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය |
|---|---|---|---|
| 1. | 1 | 11. | 3 |
| 2. | 2 | 12. | 1/4 |
| 3. | 3 | 13. | 3 |
| 4. | 3 | 14. | 5 |
| 5. | - | 15. | 3 |
| 6. | 1 | 16. | 4 |
| 7. | 2 | 17. | 1 |
| 8. | 5 | 18. | 5 |
| 9. | 3 | 19. | 3 |
| 10. | 3 | 20. | 5 |

- 5 වන ප්‍රශ්නයෙහි නිවැරදි පිළිතුරක් නැත. එහි පළමුවන පිළිතුර වෙසෙස් දොරටුව/ විශේෂ ද්වාරය ලෙස සංශෝධනය කර ගන්න. අපේක්ෂකයන්ට එකී ප්‍රශ්නයට ඕනෑ ම පිළිතුරකට ලකුණක් ලබා දෙන්න.

02. (අ) අවබෝධය

(i) • සිංහල භාෂාව සංස්කෘත, මාගධ භාෂාවලින් පහළ වූ බව

• ඒ ඒ භාෂාවලට සමාන්තර ව සිංහල භාෂාව ස්වාධීන ව වර්ධනය වූ බව.

(එක් කරුණකට එක් ලකුණ බැගින් ලකුණු 02කි)

(ii) හෙළ බසෙහි ලකුණු ආරක්ෂිත ව පැවතියේ ගද්‍යයෙහි නොව පද්‍යයෙහි වීම නිසා

(iii) කුමාරතුංග මුනිදාස මහතා විසිවැනි සියවසේ සිංහලය සංස්කෘති ආධිපත්‍යයෙන් මුදා ගැනීමට ගත් උත්සාහය

(iv) සිදත් කතුවරයා සිංහල හෝඩිය ලෙස සංස්කෘත හෝඩිය නොදැක්වීම

(v) සංස්කෘති භාෂාවෙන් කැළැල් නොවූ සිංහල භාෂාවේ ලක්ෂණ කියා පෑම.

(vi) 13 වන සියවසේ සිදත් කතුවරයා සංස්කෘත භාෂාවෙන් සිංහලය මුදා ගැනීමට උත්සාහ කිරීම

**(ලකුණු 12 යි)**



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

(ආ) සාරාංශය පිළිතුරු

පහත කරුණු සාරාංශයෙහි අන්තර්ගත විය යුතු ය.

- මිනිසා විසින් නිපදවන ලද තාක්ෂණය මිනිසාට එරෙහි ව යෙදවීම.
- තාක්ෂණය භාවිත කොට න්‍යෂ්ටික ආයුධ නිෂ්පාදනය හා අධිරාජ්‍යවාදී යුද සැලසුම් මූලික වීම
- මනුෂ්‍ය ප්‍රජාවේ විනාශයට යුද සැලසුම් හේතු වීම
- මානව පැවැත්ම ඛේදවාචකයක් කරන මේ තත්ත්වය එය කලාවේ විෂය ක්ෂේත්‍රය පුළුල් කිරීමට හා විනාශයට හේතු වීම.
- තාක්ෂණය මානව සංහතියේත් කලාවේත් වර්ධනය ඇති කිරීම
- තාක්ෂණය විද්‍යාත්මක සැලසුම්කරණයට ලක් කිරීමෙන් සාහිත්‍ය කලාවේ පුනර්ජීවනයක් ඇති කළ හැකි වීම.

ඉහත කරුණු ඇතුළත් ව ලේඛන ව්‍යවහාරයෙන් සාරාංශය ලියා තිබිය යුතු ය. සාරාංශය එක් ඡේදයක් ලෙස දක්වා තිබිය යුතු අතර, ඡේදවලට බෙදා ඇති නම්, සමස්තයෙන් ලකුණු 02ක් අඩු වේ. වචන සංඛ්‍යාව 70 - 80 අතර තිබිය යුතු ය. එම ප්‍රමාණය අඩු හෝ වැඩි හෝ වේ නම්, වචන ප්‍රමාණයට නියමිත ලකුණු 02ක අඩු වේ. ලකුණු බෙදී යන ආකාරය පහත සඳහන් අයුරිනි.

- සාරාංශයේ නියමිත වචන ප්‍රමාණයට - ලකුණු 02 යි.
- භාෂා නිරවද්‍යතාවට - ලකුණු 03 යි.
- අන්තර්ගතයට - ලකුණු 08 යි.

## (3) රචනාව

වචන සංඛ්‍යාව 300 - 350 අතර වේ නම් ඉහළ ලකුණක් ප්‍රදානය කළ හැකි ය. වචන සංඛ්‍යාව 400ට වැඩි වේ නම් හෝ 250ට අඩු වේ නම් හෝ ලකුණු 03ක් අඩු කළ යුතු වේ. වාක්‍ය රචනයට ලකුණු දීමේ දී පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කිරීම සුදුසු ය.

(i) රචනය සඳහා තෝරා ගත් මාතෘකාව යටතේ ප්‍රමාණවත් ලෙස කරුණු ඒකරාශීකරණය.

(ii) එම කරුණු සංවිධානාත්මක ව ඉදිරිපත් කිරීම.

(iii) කරුණුවල පැහැදිලි බව.

(iv) නිරවද්‍ය අක්ෂර වින්‍යාසය අනුගමනය කර තිබීම.

(v) ව්‍යාකරණ දෝෂ රහිත වීම.

(vi) භාෂාව ව්‍යක්ත ලෙස හැසිරවීම.

(vii) සුදුසු ලෙස පද බෙදීම හා ඡේද වෙන් කිරීම.

(viii) කියවිය හැකි සේ අත්අකුරු පැහැදිලි වීම.

❖ විවිධ භාෂාත්මක ප්‍රයෝග භාවිතය (මෙහි දී උපමා, රූපක, ආප්තෝපදේශ, ප්‍රස්තාව පිරුළු වැනි අංග ගැන සැලැකිල්ල යොමු කරන්න. එහෙත් ඒ වෙනුවෙන් වෙන වෙන ම ලකුණු දීම අනවශ්‍ය ය. සමස්තයක් වශයෙන් රචනාවෙහි මෙකී අංග සලකා ලකුණු ප්‍රදානය කළ හැකි ය.)



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

4. (අ) පහත සඳහන් වාක්‍යවල සදොස් තැන් ඇතොත් නිදොස් කොට ලියන්න.

(i) දක්ෂ රංගන ශිල්පියෙකු වූ ජයලත් මනෝරත්න මහතා ප්‍රවීණ නාට්‍ය රචකයෙක් ද විය.

(ii) සියලු රටවැසියෝ නීතියට අවනත විය යුත්තෝ ය./ සියලු රටවැසියන් නීතියට අවනත විය යුතු ය.

(iii) ක්‍රීඩකයන් පුහුණුවීම්වල යෙදෙනවා අපි දුටුවෙමු.

(iv) අධ්‍යක්ෂවරු තිදෙනෙක් සාකච්ඡාවට සහභාගී වූහ.

(v) වගාවන්ට සතුන් හානි කරති'යි ගොවීහු පවසති. (ලකුණු =05 යි)

(ආ) පහත සඳහන් වාක්‍ය කර්මකාරකයට හරවා ලියන්න.

(i) චාරිකාවේ දී ඔවුන් විසින් අපි දක්නා ලදුමු/ ලද්දෙමු/ දකිනු ලැබූමු/ ලැබුවෙමු.

(ii) නූතන කෙටිකතාකරුවන් විසින් කාලීන සමාජ ගැටලු තේමා කොට ගෙන කෙටිකතා ලියනු ලබයි/ ලැබෙයි/ ලැබේ.

(iii) ගුරුවරුන් විසින් ඉගැන්වීම් කටයුතුවල දී නව තාක්ෂණික උපකරණ භාවිත කෙරෙයි/ කෙරේ. කරනු ලබයි/ ලැබෙයි/ ලැබේ.

(iv) ඇය විසින් ඉතා මිහිර ව ගීයක් ගැයිණ/ ගැයිණි/ ගයනු ලැබීය/ ලැබුවේ ය/ ගයන ලදි/ ලද්දේය.

(v) නීතීඥයන් විසින් උසාවියට විත්තිකරුවෝ ගෙන්වෙති/ ගෙන්වෙත්/ ගෙන්වනු ලබති/ ලබත්/ ලැබෙති/ ලැබෙත්. (ලකුණු =05 යි)

(ලකුණු 5+ 5+ 5 = 15 යි)

(ඉ) නිවැරදි වාක්‍යයක් නිර්මාණය කිරීම සඳහා සුදුසු පදය වරහන් තුළින් තෝරා ලියන්න.

(i) දරුවන්/ විචාරකයෝ

(ii) දේශප්‍රේමීන්/ කරාවි

(iii) අමුත්තෝ/ පිළිගනු ලැබූහ

(iv) ලේඛකයෙකු/ කලාකරුවෝ

(v) අප/ මිතුරෙක් (ලකුණු =05 යි)

05.

| | | වචනය | ව්‍යාකරණ අංගය | අනු අංගය |
|---|---|---|---|---|
| 05. | (i) | සම්භාෂණයට | උපසර්ග | මනා යන අර්ථය/ තීව්‍රාර්ථය |
| | | බහුතරයක් | ප්‍රත්‍යයාර්ථ නාම | තද්ධිත |
| | | වස්ත්‍රාභරණයෙන් | සන්ධි | සමාස ස්වර දීර්ඝ සන්ධි/ සවර්ණ ස්වර දීර්ඝ සන්ධි |
| | (ii) | ගංදැලෙහි | සන්ධි | ගාත්‍රාක්ෂර ලෝප සන්ධි/ ගතකුරු ලොප් සඳ |
| | | තුරුමුදුන්වල | විභක්ති | ආධාර විභක්ති/ අදර විබත් |
| | | නිසොල්මන්ව | උපසර්ග | විරෝධාර්ථය/ නිෂේධාර්ථය/ නැත යන අර්ථය |
| | (iii) | නැඟී | ක්‍රියා | පූර්ව ක්‍රියාව/ පෙර කිරිය |
| | | ඇදෙන | කෘදන්ත | වර්තමාන කාල (කර්මකාරක) කෘදන්ත |
| | | දියකඩනය | කෘදන්ත | කරණාර්ථ/ කරණකාරක කෘදන්ත |
| | (iv) | උද්ගත | උපසර්ග | භූෂණාර්ථය/ අර්ථෝද්දීනාර්ථය/ වඩා යන අර්ථය |
| | | ගැටලු | තද්ධිත | සහිතාර්ථය |
| | | විසඳුම් | කෘදන්ත | භාවාර්ථ කෘදන්ත/ භාවකාරක කෘදන්ත |
| | (v) | පෞරාණික | තද්ධිත | ඊට සම්බන්ධ යන අර්ථය |
| | | ලීකැටයම් | සමාස | (කරණ) විභක්ති සමාස/ (කරණ)විබත් සමස් |
| | | කුඩා දරුවෝ | විශේෂණ | නාම විශේෂණ |

(ලකුණු (01×03)×05 =15 යි)



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources

06. (අ) පහත දී ඇති වාක්‍යවල හිස්තැනට වඩාත් ම ගැළපෙන පදය වරහන තුළ දී ඇති පද අතුරෙන් තෝරා ලියන්න.

(i) උපදේශ (ii) උපකරණ (iii) මෙවලම්

(iv) උපදෙස් (v) භූමිය (vi) බිම (ලකුණු (1/2×6 =03යි)

(ආ) (i) දන්තාරෝග්‍ය (ii) රත්මලාන (iii) බුද්ධීන්ද්‍රිය

(iv) පුනරුත් (v) දංපිටිය/ දම්පිටිය (vi) **සුදුස්සෝ** (ලකුණු (1/2×6 =03යි)

(ඉ) තද කළු අකුරෙන් මුද්‍රිත වචනය අයත් විභක්තිය නම් කරන්න.

(i) ආධාර විභක්තිය/ අදර විබත්

(ii) සම්බන්ධ විභක්තිය/ සබඳ විබත්

(iii) කරණ විභක්තිය/ කරණ විබත් (ලකුණු (1×3 = 03 යි)

**(ලකුණු 3 + 3+ 3+ 3+ 3 = 15 යි)**

**(ඊ) සුදුසු තැනවල විරාම ලක්ෂණ යොදා පහත දැක්වෙන පාඨය නැවත ලියන්න.**

වධකයා කඩුව ගෙන එක් ම ජ්‍යෙෂ්ඨ පුත්‍රයාණෝ බිය පත් ව දුවන්නට වන්හ; ළෙහි අත් ගසන්නට වන්හ; මේ දුටු මද්දුම බණ්ඩාරයෝ වහා ඉදිරියට පැන අභීත සිංහ ස්වරයක් විහිදුවා, "බිය නොවන්න අයියණ්ඩි, මැරෙන හැටි මම පෙන්වමි" යනුවෙන් පවසා, "එම්බා ගහලය, තාගේ අසිපතින් මාගේ බෙල්ලට ගසා, හිස කඳින් වෙන් කරව"යි කියා දංගෙඩිය මත්තෙහි හිස තබා ලූහ. "දරුවෙනි, ඔළමොළකම් නොව එඩිකම් වඩවු! හීනදීනකම් නොව සුරුවිරුකම් වඩවු!

(ඡේදයෙහි යෙදී ඇති විරාම ලක්ෂණ හැර අනෙක් තැන් ගැන පමණක් අවධානය යොමු කරන්න.)

**(ලකුණු 03 යි)**

**(උ) පහත ප්‍රකෘති කථන විකෘති කථනයට හරවා ලියන්න.**

(i) තමාගේ නිදහසට කරුණු කියන මෙන් විනිසුරුවරයා විත්තිකරුට නියම කළේ ය.

(ii) තමාගේ පවුල ම නැති වුණු බව කියා මුදලාලි හිස අත තබා ගත්තේ ය.

(iii) තමා ඊයේ නපුරු හීනයක් දුටු බව දරුවා මවට පැවසීය. (ලකුණු (1×3 = 03 යි)

07. **පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

(i) භාෂාත්මක, මාධ්‍යයෙහි, ලේඛකයෙකු, විද්‍යාත්මක, විශේෂත්වය, ශක්තියක්

(අකාරාදි පිළිවෙළ නිවැරදි නම් ලකුණු 03ක් දෙන්න. එකක් හෝ වැරදි නම් ලකුණු හිමි නොවේ.)

(ii) **අභිමත/ සම්පාදනය/ වික්‍රමයක්** (ලකුණු (01×3 =03 යි)

(iii) **භාෂා - ආධිපත්‍යයක්**

**අන්‍ය - ආකාර**

**නිශ්චිත - අර්ථ** (ලකුණු (01 × 3 = 03 යි)

(iv) **මූලික - දීර්ඝ පාපිල්ල, කෙටි ඉස්පිල්ල**

**හැඟීම් - කෙටි ඇදය, දීර්ඝ ඉස්පිල්ල (හල් කිරීම හෝ හල්පිල්ල කියා ලියා ඇතොත් ලකුණු නොලැබේ.)**

**හසුරුවා - කෙටි පාපිල්ල, කෙටි පාපිල්ල, ඇලපිල්ල** (ලකුණු (01 × 3 =03 යි)

(v) අඝෝෂ මහාප්‍රාණ - ඛ, ඨ

(අකුරු පමණක් ලිවිය යුතු ය. අකුර ඇතුළත් වචනය ලියා ඇත්නම් ලකුණු හිමි නොවේ. ලකුණු 02කි)

ඝෝෂ මහාප්‍රාණ - ධ, භ

(එක් අකුරුක් ලිවීම ප්‍රමාණවත් ය. අකුර ඇතුළත් වචනය ලියා ඇත්නම් ලකුණු හිමි නොවේ. ලකුණු 01කි)

**(ලකුණු 3 + 3+ 3+ 3+ 3 = 15 යි)**



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources

08. පහත සඳහන් මාතෘකාවලින් තුනක් තෝරා ගෙන කෙටි සටහන් ලියන්න.

(i) අපර ක්‍රියා

අවසාන ක්‍රියාවට පසුව සිදු වන ක්‍රියාව අපර ක්‍රියා නමින් හැඳින්වේ.

උදා :- මම අකුරු කරනුව පාසලට යමි.

ඔවුහු කවි කියන්නට සැරසෙයි.

අපි සිංහල ප්‍රශ්න පත්‍රයට ලියනු පිණිස සූදානම් වෙමු.

(ii) ගාත්‍රාදේශ සන්ධි

ව්‍යංජන ශබ්දයක් වෙනුවට ව්‍යංජන ශබ්දයක් ආදේශ වීමෙන් නිර්මාණය වන සන්ධි ගාත්‍රාදේශ සන්ධි නමින් හැඳින්වේ. සිදත් සඟරාවට අනුව මෙකී සන්ධිය ආකාර තුනකි. එනම්,

(i) අපර පදයේ ඇති 'ක' වෙනුවට 'ව' හෝ 'ය' ආදේශ වීම ද,

(ii) 'ද්' වෙනුවට 'ත්' ආදේශ වීම හා 'බ්' වෙනුවට 'ප්' ආදේශ වීම හා

(iii) පූර්ව පදයෙහි ඇති ව්‍යංජනයක් වෙනුවට ව්‍යංජනයක් ආදේශ වීම යනාකාරයෙනි.

- අපර පදයේ 'ක' වෙනුවට 'ය' හෝ 'ව' ආදේශ වීම.

සන්ධි වන පද දෙකක් අපර පදයේ මුල ඇත්තේ 'ක' ව්‍යංජනය යෙදී තිබේ නම් එකී ව්‍යංජන ශබ්ද වෙනුවට 'ව' හෝ 'ය' ආදේශ වීම සිදුවනු දක්නට ලැබේ.

සැ. යු. : මෙකී සන්ධියේ, පූර්ව පදය අග ස්වර ශබ්දයක් තිබිය යුතු ය.

උදා:- දඩ + කම් (වි) → ය → දඩයම් (ස)

දඬු + කම් (වි) → ව → දඬුවම් (ස)

- 'ද්' වෙනුවට 'ත්' ආදේශ වීම හා 'බ්' වෙනුවට 'ප්' ආදේශ වීම.

පූර්ව පදයේ අග 'ද' ශබ්දයක් යෙදී ඇති විට එහි ඇති ස්වරය ලොප් කොට ඉතිරි වන 'ද්' කාරය වෙනුවට 'ත්' කාරය පැමිණීමත් පූර්ව පදයේ අග 'බ' කාරය යෙදී ඇති විට එකී ශබ්දයේ ඇති ස්වරය ශබ්ද ලොප් කොට ඉතිරිවන 'බ්' කාරය වෙනුවට 'ප්' කාරය පැමිණීමත් හේතුකොට ගෙන නිර්මාණය වන සන්ධි දෙවන ගාත්‍රාදේශ සන්ධි වර්ගය යි.

උදා:- බුදු + සරණ (වි) → බුද් + ~~උ~~ + සරණ → ත් → බුත්සරණ (ස)

කබ + පිල් (වි) → කබ් + ~~අ~~ + පිල් → ප් → කප්පිල් (ස)

පූර්ව පදයෙහි ඇති ව්‍යංජනයක් වෙනුවට ව්‍යංජනයක් ආදේශ වීම.

පූර්ව පදයේ අග ඇති ව්‍යංජනයක් වෙනුවට ව්‍යංජනයක් ආදේශවීම සිදු වීම තෙවන වර්ගයේ ගාත්‍රාදේශ සන්ධි වර්ගය යි.

උදා:- පස් + සිල් (වි) → න් ('ස්'>'න්' ආදේශය) → පන්සිල් (ස)

රත් + ගම (වි) → ද් ('ත්'>'ද්' ආදේශය) → රද්ගම (ස)

යම්+තම් (වි) → න් ('ම්'>'න්' ආදේශය) → යන්තම් (ස)

ගම්+සභාව (වි) → ං ('ම්'>'ං' ආදේශය) → ගංසභාව (ස)



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources

(iii) අව්‍යය සමාස

අව්‍යය පදයක් මුල් පදය ලෙස යෙදී යම් සමාස පදයක් නිර්මාණය වේ නම් එකී සමාස පද අව්‍යය සමාස නම් වේ.

උදා : සු + දන > සුදන

පද දෙකක් හෝ ඊට වැඩි ගණනක් එකට එකතු වීමෙන් නිර්මාණය වන ඒකාර්ථයක් පළ කරන පද සමාස පද ලෙස හැඳින්වෙන බව ඉහත සාකච්ඡා කොට ඇත. එබැවින් 'සුදන' යනු සමාස පදයක් බැව් නොරහසකි. එය නිර්මාණය වීමේ දී පළමු පදය උපසර්ග පදයක් වන බැවින් එකී සමාසය අව්‍යය සමාස වේ. උපසර්ග අයත් වන්නේ අව්‍යය පද ගණයට බැවිනි.

**අව්‍යය සමාස පිළිබඳ සාම්ප්‍රදායික අදහස**

අව්‍යය සමාස පිළිබඳ සිදත් සඟරාව ඉදිරිපත් කරන අදහසට අනුව ප්‍රධාන කොටස් හතරකට වර්ග කළ හැක. එනම්,

(1) 'යව්' ආදි ගණය

(2) 'කු' ආදි ගණය

(3) 'ප' ආදි ගණය

(4) 'න' ආදි ගණය යනුවෙනි.

'යව්' ආදි ගණය

'යව්' ආදි ගණයට **යව්, යත, අනු** යන අව්‍යය පද අයත් ය. 'යව්' හා 'යත' නිපාත වන අතර 'අනු' උපසර්ගයක් වෙයි.

උදා :- **යව්දිව්**

**යව්දිව්අමත්**

**යව්අමත්**

**යතවිදි**

**යතලබ**

**අනුබල**

**අනුරූ**

**අනුරති**

මාතෘ භාෂාවල යෙදුණු නිපාත වන යාව > යව් ලෙස ද, යථා > යත තද්භව වී ඇත. ඒ අනුව, යාවජීව, යථාලාභ ආදිය ද අව්‍යය සමාස සේ සැලකීමේ වරදක් නැත.

'කු' ආදි ගණය

**'කු'** ආදි ගණයට **කු, සු, දු, දුර්** යන අව්‍යය පද අයත් ය.

උදා : **කුකවි**

**කුදිටි**

**කුපුරිස්**

**සුදන**

**සුසිරිත්**

**සුහද**

**සුනිල**

**දුදන**

**දුබල**



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources

**දුර්ගුණ**

**දුර්ජන**

'ප' ආදි ගණය

'ප' ආදි ගණයට **ප, ප්‍ර, උප, සහ** යන අව්‍යය පද අයත් ය.

උදා :- **පබල**

**ප්‍රබල**

**උපවන**

**උපගුරු**

**සහජාත**

'න' ආදි ගණය

'න' ආදි ගණයට නැත (නිෂේධාර්ථය) යන අර්ථයෙන් යෙදෙන අව්‍යය පද අයත් ය. අ, අන්, නො, නු, නි, වි ආදි රූපවලින් මෙකී ගණය ඉදිරිපත් විය හැකි ය.

උදා :- න - මර > **අමර**

න - මිල > **අමිල**

න - ඉටු > **අනිටු**

න - සුර > **අසුර**

න - ගුණ > **අගුණ**

න - මිනිස් > **නොමිනිස්**

න - අදර > අනදර

න - දුර > **නුදුර**

න - කුසල් > **අකුසල්**

න - උක්ත > **අනුක්ත**

න - හඬ > **නිහඬ**

න - මල > **නිමල**

න - දුක් > **නිදුක්**

(iv) **කුත්සිතාර්ථයේ නිපාත**

කැත හෙවත් නින්දිදාර්ථය හඟවන නිපාත මෙයට අයත් ය.

- **<u>දු/ දුර්, දුෂ්, දුශ්, දුස්/ අව/ අප/ පර</u> යන උපසර්ග**

**දුදන, දුසිරිත්, දුශ්ශීල, දුෂ්කර, දුස්සාධ්‍ය, අවගුණ, අවමාන, අපවාද, අපපාය, පරසිරිත්, පරගැති**

(v) **ගෞරවාර්ථ තද්ධිත ප්‍රත්‍යය**

**'ආණ, අණු, අණි'** යන තද්ධිත ප්‍රත්‍යය ගෞරවාර්ථ තද්ධිත ප්‍රත්‍යය යි. ඒකවචන අර්ථ ඇති නාම ප්‍රකෘතිවලට මෙකී ප්‍රත්‍යය එක් වී ගෞරවාර්ථ බහුවචනයක් නිර්මාණය කරයි. එකී ගෞරවාර්ථ බහු වචන සමඟ යෙදෙන ආඛ්‍යාත බහුවචන විය යුතු ය. ආණ, අණු යන තද්ධිත ප්‍රත්‍යය එක්වන්නේ පුරුෂ ලිංගාර්ථ නාම ප්‍රකෘති සමඟ යැයි මතයක් තිබුණ ද 'ආණ' යන තද්ධිත ප්‍රත්‍යය අප්‍රාණවාචී නාම ප්‍රකෘති සමඟ ද එක් වෙයි. 'අණි' යන ප්‍රත්‍යය ස්ත්‍රී ලිංගාර්ථ නාම ප්‍රකෘති සමඟ යෙදේ.

**පිය + ආණ > පියාණ**



www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers - Model Answers - Study Resources
iexamhub

තෙර + අණු > තෙරණු

මා + අණි > මැණි

දරු + ආණ > දරුවාණ

මුතු + අණු > මුත්තණු

මයිල්+ අණු > මලණු

මල් + අණු > මලණු

බෑන + අණු > බෑනණු

සිටු + ආණ > සිටාණ

මුහුදු + ආණ > මුහුදාණ

නිදුක් + ආණ > නිදුකාණ

නැඳි + ආණ > නැන්දණි

මුතු + අණි > මිත්තණි

දූ + අණි > දුවණි/දියණි

හැඳින්වීමට ලකුණු 02 යි

උදාහරණවලට ලකුණු 03 යි.

(ලකුණු 05 × 03 = 15 යි)



iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers Model Answers - Study Resources